
භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 ජූලි - අගෝස්තු | 125 වන කාණ්ඩය - 04 කලාපය | පිටු 32 | DOP/NEWS/01/2024

## බලය ?



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# දකුණ නැගෙනහිර...

ගී පද - අරිසෙන් අහුබුදු ශූරීන්
තනු නිර්මාණය - සුනිල් සාන්ත ශූරීන්
ගායනය - සුනිල් සාන්ත ශූරීන්



**දකුණ නැගෙනහිර බටහිර උතුරද**
**එක කොඩියේ සෙවණේ**
**එකම දැයක් වී මහ බලයක් වී**
**පෙරටම යමු ලංකා ලංකා**
**ඉපැදුණු අප හට ලක් පොළොවේ**
**සුරුවිරු කම් උපතින් හුරුවේ**
**දක්වමු දස්කම් ලක්කම් විස්කම්**
**විස් මවමින් මුළු ලෝ**

**කන්දට කෙන්දට කොන්දට හුරු වී**
**වන් වත් අතැ හුරු වී**
**විපත පවා සැපතට හරවා ලා**
**පෙරටම යමු ලංකා ලංකා**
**ඉපැදුණු අප හට ලක් පොළොවේ**
**සුරුවිරු කම් උපතින් හුරුවේ**
**දක්වමු දස්කම් ලක්කම් විස්කම්**
**විස් මවමින් මුළු ලෝ**

**වැටුණත් නැගිටිමු වැටි වැටි නැගිටිමු**
**නැග නැග යමු දියුණේ**
**බාධාවලටද බාධා ගෙනදී**
**පෙරටම යමු ලංකා ලංකා**
**ඉපැදුණු අප හට ලක් පොළොවේ**
**සුරුවිරු කම් උපතින් හුරුවේ**
**දක්වමු දස්කම් ලක්කම් විස්කම්**
**විස් මවමින් මුළු ලෝ**

සුනිල් සාන්ත ශූරීන් ගායනා කළ "දකුණ නැගෙනහිර" ගීතය වනාහි මේ පරම සත්‍යය දේශයට ආදේශ කොට අරිසෙන් අහුබුදු ශූරීන් ලියූ සදා නොමියෙන වචනාවලියකි. මහා බලයක් රට තුළ ගොඩ නැගිය හැක්කේ "එකම දැයක් වී" සමඟියෙන්, එක්ව යන ගමනක් තුළ පමණක් බව එතුමෝ අපට සිහි ගන්වති. ජාතින් ලෙස බෙදී, දේශයේ දූ පුතුන් යුද රකුසාට බිලි දුන්නේ මේ ලක් පොළොවේ වෙසෙන අපි වෙමු. ආගම් ලෙස බෙදී කුලල් කමින්, සැකයේ වෛරයේ ගිනි ඇවිලුවේද මේ ලක් පොළොවේ වෙසෙන අපිම වෙමු. "විපත පවා සැපතට හරවාගෙන" පෙරටම යා හැකිව තිබූ මේ පුණ්‍ය භූමිය මෙලෙස විනාශ මුඛයට ඇද වැටීමේ ප්‍රධාන හේතුව අපගේම අසමඟිය නොවේද?

ඒ අමිහිරි අතීත වැරදි විටින් විට සිහිපත් කර ගැනීම, ස්වයං විවේචනයකට ලක් කිරීම යහපති. ඒ වැටීම්වලින් පාඩම් උගෙන, අනාගත දරුවනට යහපත් හෙටක් තනා දීමේ වගකීම, වත්මන් වැඩිහිටියා සතුය. එබැවින්, "වැටුණත් නැගිටිමු වැටි වැටි නැගිටිමු" ලෙස රචකයා කරන දයාබර ආරාධනාව අද මෙන් හෙටත් වලංගු වේ. "බාධාවලටද බාධා ගෙනදී" එක්ව රට ගොඩ නැංවීමේ සාමූහික ප්‍රයත්නයේ කොටස්කරුවකු වනවාද, එසේත් නැතිනම්, ඒ සමඟි බලයට බාධා කරන්නකු වනවාද යන තීරණය වර්තමානයේ දිවි ගෙවන ඔබ හා මා ඉදිරියේ ඇති තීරණාත්මක පැනයකි. බලය අයුතු ලෙස යොදා ගනිමින්, අසමඟිය වපුරවමින්, තම "ඡන්ද ගොඩ" වැඩිකර ගන්නා අතිශය ආත්මාර්ථකාමී දේශපාලකයන්ගේ උගුල්වලට තවදුරටත් නොරැවටෙන්නට කාලය එළැඹ ඇත. දමිළ සිංහල මුස්ලිම් ලෙසින් නොබෙදී, එක කොඩියේ සෙවණේ රැඳෙමින් පෙරටම යන්නට සුනිල් සාන්ත ශූරින් කරන ආරාධනාව සැබවින්ම කාලෝචිත වන්නේ එබැවිනි. දේශානුරාගී ගී අතරින් විශේෂ ස්ථානයක් උසුලන මේ ගීතය, දැයේ පිනට බිහිවූ ගීතයක් යැයි පැවසීම අතිශෝක්තියක් නොවේ.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නිමනි පියතුමා**
අධ්‍යක්ෂ, 'මැසනඩ් යොවුන් පියස', සා. විසෙන්ති නිවාසය, මග්ගොන.

# ශක්ති ප්‍රබෝධනය

2024 ජූලි - අගෝස්තු

**ප්‍රකාශනය**
නිර්මල මරිය නිකාය

**භාරකරු**
අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කවරය නිර්මාණය**
අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**
ආනන්ද නාගහගේ

**මුද්‍රණය**
කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
5 සමිඳු කෙත සරු කළ කොළොම්පුර ... ගරු මර්ල් මෙන්ඩිස් ... - ටී සුනිල් ප්‍රනාන්දු
6 බලය පිළිබඳ කිතුනු දැක්ම ... මලින්ත බෝපෙආරච්චි
8 දෙවියන්වහන්සේට වඩා නපුර ... ගරු නිලූෂන් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
10 ශුද්ධාත්ම බලය තුළ බලවත් ... ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න
12 පාරාවළල්ලක් නොවිය යුතු බලය ශල්‍ය වෛද්‍ය සචිත මෙන්ඩිස්
14 ආගම උපකරණයක් - සපුගස්කන්දේ රංජිත්
15 ප්‍රේමයේ බලය සහ ... - මහින්ද නාමල්
16 බලය ජනගතකරණය - වී. ලෙ. පීරිස්
18 සියලු බලයන්ට ඉහළින් ... - බුද්ධික සඳරුවන්
20 රටට තියෙන ... - පස්කල් ජයමාන්න
ඇලොයි පිය උපහාර - ගාමිණී අමරසේකර
21 කාව සිත - චමත් බි පයාගල
බලය - අයිරින් කොස්තා
අමිතගේ හද ගැස්ම - සී. අමිත
22 **Power** - Fr Emmanuel Fernando OMI
23 උද්දච්ච මෝඩයෝ ... - සපුගස්කන්දේ රංජිත්
24 සුහද ආරාධනා ...
මුතු ඇටය බබලන...- පී. ඩබ්ලිව්. සුනිල් ප්‍රනාන්දු
25 ඕං එහෙනං - සූරිය මාමා
26 පුංචි විකුම් - තරු නැන්දා
27 ප්‍රහේලිකා අංක - 80 ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා
28 ප්‍රහේලිකා අංක 78 පිළිතුරු
29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ... එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

අද්විතීය ස්වභාව සෞන්දර්යකින් හෙබි ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව වර්තමානය වන විට ශෝචනීය ලෙස ආර්ථික, සමාජීය සහ දේශපාලනික වශයෙන් මහා අග්නි ජාලාවක දැවෙන්නට වී ඇත. මීට වගකිවයුත්තෝ දේශපාලනඥයන් පමණක් ද? නැත. රටෙහි ප්‍රගමනය වෙනුවෙන් සක්‍රියව දායක විය යුතු පුරවැසියන් ලෙස මෙවර පැහැර නොහැරිය යුතු වගකීමක් ඇත. එසේ නම් දැවෙන රට තවත් දැවෙන්නට නොදී රටෙහි පරිපාලන බලය නිවැරදි දෑතකට පැවරීමේ වගකීම නිසිලෙස ඉටුකරමින් අප සොඳුරු මව්බිම සෙනෙහසින් රැකගනිමු යන්න මෙවර කවරයේ කථාව වේ.

අචල රූපසිංහ

### භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපෑල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

### BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# බලය හෙළිදරව්ව

බලය යනු ශක්තියයි. බලය විවිධාකාරය. කාය ශක්තිය, මානසික ශක්තිය සහ ආධ්‍යාත්මික ශක්තිය ද බලයකි. දේශපාලන භූමියේ දී ඡන්ද බලය තවත් මහා බලයකි. එමෙන්ම, එය ආණ්ඩු කිරීමට පිරිසකට ලැබෙන බලයකි. මේ ආකාරයට බලය විවිධ මාන ඔස්සේ විග්‍රහ කර ගත හැකිය. මහල්ලාගේ සිට කුඩා දරුවා දක්වා ම ඒ ඒ ජීවිත පැවතුම් තුළ අඩුවැඩි වශයෙන් බලය ක්‍රියාත්මක වේ.

ලංකාවේ දේශපාලනඥයන් හා ආණ්ඩු කරවන ඇත්තන් හැසිරෙන්නේ අසීමිත බලයක් ආරූඪ කරගත් අය වශයෙනි. නීති හදන්නට සහ නීති කඩන්නට පමණක් නොව සත්‍ය වසන් කර ව්‍යාජ අයුරින් පාර්ලිමේන්තුවේ රැඳෙන්නට පවා ඔවුනට බලයක් තිබුණ බව පසුගිය දා උසාවිය දුන් නඩු තීන්දුවක් මගින් ජනතාව හොඳින්ම අවබෝධ කර ගත්හ. විවිධ ක්ෂේත්‍රවල වගකීමක් දරන උදවිය පවා කලට වෙලාවට නීතිය ඉෂ්ට කරන්නට මැලි වූයේ දේශපාලනඥයන්ගේ බලය ඔවුන්ගේ නීතිවල ඇති බලයට වඩා බලවත් බව නීතිය ක්‍රියාත්මක කරන උදවිය දැනගත් නිසාදෝ යන්න කෙනකුට සිතිය හැකිය.

ශ්‍රී ලංකාව අද බංකොලොත් රටක් ලෙස ප්‍රකාශ වී හමාරය. අද හිඟමන් ඉල්ලන රටක් බවට අප රට පත්ව ඇත. එහෙත් ශ්‍රී ලංකාව එලෙස හිඟමන් ඉල්ලන්නට අවශ්‍ය රටක් නොවේ. ලෝකයේ සමහර රටවලට ස්වාභාවික සම්පත් අඩුය. ස්වාභාවික ව්‍යසන වැඩිය. වරායවල් නැතිකම, කාන්තාර තිබීම, සටන්වලට සහ යුද්ධවලට නිතර නිතර ගොදුරු වීම, නූගත්කම, ඇතැම් මිථ්‍යා විශ්වාසයන්, අන්තවාදය වැනි බොහෝ සාධක නිසා ඇතැම් රටවල් දුප්පත් වී ඇත. එහෙත් අපට ඉහත සඳහන් කළ බොහෝ නරක දෑ ඉතා අඩුය.

එහෙත් ඇතැම් දේශපාලනඥයෝ පුරවැසියාගේ ඡන්ද බලය ගැනීමට ජාති, ආගම්, කුල ඇතුළු විවිධ දෑවලින් භේදභින්න කරන්නට ඉතාමත් අදූරදර්ශී උප්පරවැට්ටිවල නිරත වූහ. ඇතැම් මිනිස්සු රැවටුණාහ. නිදසුනක් ලෙස සිංහල බෞද්ධ මව්වරුන්ව වඳ කරන්නට තවත් ආගමික කණ්ඩායමකට අයිති වූවන් කටයුතු කර ඇතැයි ප්‍රචාරය කළහ. අද ඒ සියලු චෝදනා පුස්සක් වී හමාරය. යහපත් දේශගුණය, ජලය, සාරවත් භූමි, සදාහරිත වනාන්තර මේ ආදී බොහෝ දෑ දෙවියන්වහන්සේ මේ රටට දායාද කර ඇති සම්පත් ය. ලංකා පොළොවේ ඕනෑම ස්ථානයක, එලදායී භෝගයක් වවන්නට පරිසරයක් සහ පසක් ඇත. රට වටකර සාගරයකි. ඒ නිසා මත්ස්‍ය සම්පත් බහුලය. ගංගා, ඇළ, දොළ, වැව්, ජලාශ ආදිය නිසා මිරිදිය මසුන්ද එමටය. ඉතා ප්‍රණීත පලතුරු, සහ එළවළු, සහල් සහ ධාන්‍ය වර්ග ගණනාවක් වගා කරන්නට හැකි රටකි ලංකාව. වැලි, මැටි, කළුගල්, මැණික්, කොරල් පර වැනි ස්වාභාවික සම්පත්වලින් පිරිපුන් රටකි. බහුතර මිනිසුන්ට තමන් ගොඩ නැඟීමට කළ යුතු කැපකිරීම, වැයවීම කරන්නට, පරිශ්‍රමය යොදවන්නට වුවමනාවක් පෙරටත් වඩා අද ඇත. එහෙත් මේ රටට මේ අවාසනාවන්ත, අභාග්‍ය සම්පන්න කාලකණ්ණි තත්ත්වය ඇති කර ඇත්තේ තම බලය වැරදි ලෙස අත්තනෝමතිකව තම සුඛවිහරණය හෝ තම කුටුම්බයට අධික ලෙස යස ඉසුරු ලබා දෙන්නට ක්‍රියාත්මක වූ අතිශයින්ම දුර්වල, දූෂිත දේශපාලන පිරිසක් සේම, ඔවුනට එකතු වූ රාජ්‍යය නිලධාරින්ගේ සමහරුන්ද ඇතුළු ඇතැම් කූට ව්‍යාපාරික පැලැන්තියක් එකට එකතු වී කාලයෙන් කාලයට මේ රටේ ධනය හොරා කෑම නිසා යන්න අද බොහෝ දෙනා අවබෝධ කරගෙන ඇත.

අද අප මව් බිම මෙවන් ප්‍රපාතයකට ඇද දමා ඇත්තේ කවුරුන්ද යන්න ඇතැම් නඩු තීන්දුවලින් සහ ජනතාවගේ අත්දැකීම්වලින් ද හෙළිදරව් වී ඇත. මුද්‍රිත මෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය විචාරශීලිව නිරීක්ෂණය කිරීමේදී මෙය ඉතා පැහැදිලිව අවබෝධ කරගන්නට සාක්ෂි ඕනෑ තරම් ඇත. ඩොලර් බිලියන ගණනින් ණය පිටරටින් ගෙන, රටට එලදායී නොවන හිස් සෝබන ව්‍යාපෘති නිර්මාණයකර, රට ණයකර, දැරිය නොහැකි දුක් ගිනි කන්දරාවක් විඳින්නට අසරණ ජනතාවට අද සිදුවී ඇත. එය තමන්ට ලැබුණු දේශපාලන බලය අපයෝජනය කළ නිසාය. එහෙත් තවමත් මේ තත්ත්වය කියවා ගන්නට නොහැකි

උදව්ය තම වාසි හා ලාභ නිසාම දේශපාලන පක්ෂවල වහලුන් සේ තවමත් සත්‍ය නොදකිමින් පක්ෂවලට ආවඩන අයුරින් සිටීම ඉතාමත් අවාසනාවන්තය, කණගාටුදායකය. රටක් විනාශය කරා ගෙනයාමේ පෙර ගමන්කරුවන් ලෙස ඔවුන් ඉතිහාසයට එකතුවීම වැළැක්විය නොහැකිය.

ඕනෑම ව්‍යාපෘතියක් ලංකාවට එනවිට එයින් 10%, 20%, සහ 50% මේ ආදි ලෙස කොමිස් ඉල්ලන්නට තරම් රට කරවන ඇත්තන් මුදලට කෑදර වී ඇත. දූෂිත කම්බ හොරු රැළක් ඉන්නා රටක් ලෙස ශ්‍රී ලංකාව අද මුළු ලෝකයේම අවධානයට යොමු වී ඇත. අප රටට ප්‍රයෝජනවත් වැදගත් ආයෝජනයක් නොඑන්නේ මන්ද යන්න වරක ජර්මානු වාණිජ හා කර්මාන්ත නියෝජිත පිරිසේ ප්‍රධානී ජර්මානු ජාතික මාරි ඇන්ටෝනියෝ "Daily Mirror" පුවත්පතට දෙන ලද සාකච්ඡාවකදී අනාවරණය කළාය. ඇය පවසන්නේ දූෂණය සහ අකාර්යක්ෂමතාව නිසා අයෝජකයින් ලංකාව තෝරා ගන්නේ නැත, යන්නය.

මැතිවරණයක් ළං වන විට විවිධ වරදාන දී අසරණ මහජනතාව රවටන්නේ අද ඊයේ සිට නොවේ. පසු ගිය මැයි පළමුවන දා වතුකම්කරුවන්ගේ වැටුප රු. 1700.00 ක් දක්වා වැඩි කළ බව ප්‍රසිද්ධියේ මහජන රැලියකදී පැවසීම මෙයට කදිම උදාහරණයකි. මෙතරම් මහජනතාව මුළා කරන්නට තරම් ලජ්ජාවක් හෝ බියක් නැත්තේ මේ අය අසංවේදී, ගල් හිතක් ඇති බලයට පෙරේතකමක් ඇති දේශපාලනඥයන් වීම නිසාය. ඔවුන් කොපමණ වයසට ගියද, දශක ගණනාවක් බලයේ රැඳී සිටියද, දේශපාලනයේ ඉහළම තානාන්තර දැරුවත්, විශ්‍රාම වැටුප් ගත්තද, බලය කොපමණ අපයෝජනය කළද, රට ගොඩ ගන්නට පුළුවන් යයි පවසමින් නැවත නැවත ජනතාව මුළා කරන්නට අර අදින්නේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පීඩාවට පත්වූ වින්දිතයන්ට ඉතා ඉක්මනින් සාධාරණත්වයක් ඉෂ්ට කරනවා යයි අතීත දිනයක පොරොන්දු වූ ආකාරයෙන්මය.

මෑතක්වන තුරුම සති අන්තයේ ඉරිදා රාත්‍රියේ රූපවාහිනියේ විකාශනය වූ "සිහිනයකි රෑ" ස්වභාවිත ගී වැඩ සටහන ප්‍රේක්ෂකයන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් වැළඳ ගත් හ. හදවත්වල වියළි ස්වාභාවය නැති කරමින් තෙතමනය, සංවේදිතාවය, ආදරය, කඳුල සහකම්පනය වැනි ගුණාංග ඇති කරන්නට, මනුෂ්‍යත්වය සහ වටිනාකම් මතු කළ වැඩ සටහනකි එය. එකී වැඩසටහනට හිටි හැටියේ කුමක් වුවාද යන්න නිවේදකයකු ඇසූ විට "සිහිනයකි රෑ" වැඩ සටහනේ නිර්මාතෘ මහේෂ් නිස්සංක මහතා මෙලෙස පැවසුවේය. "ඕනෑම යහපත් දෙයක් කරගෙන යන විට ඒ කෙරෙහි යහපත් විධියට දකින්න පුළුවන් පිරිස වගේම ඒ කෙරෙහි ද්වේෂ සහගතව බලන මිනිසුන්ද බිහිවෙනවා. සමහර වෙලාවට ඒ ද්වේෂ සහගත විධියට බලන මිනිසුන්ගේ අතේ බලය ඇත. යහපත් විධියට බලන මිනිසුන්ගේ අතේ බලය නැත. එයාට ඇත්තේ පුරවැසි බලය පමණකි. එහෙත් ද්වේෂ සහගත විධියට බලන මනුෂ්‍යයාට මේ රටේ පුරවැසි බලය අබිබවා ගිය දේශපාලනික සහ ධනවාදී බලයක් ඇත. එයා එය ක්‍රියාත්මක කිරීමේ එක ප්‍රතිඵලයක් ලෙස සිහිනයකි රෑ වැඩසටහන ඝාතනය විය. තිත්ත දේශපාලනයේ ඇත්ත කථාව වන්නේ මොනතරම් යහපත් වැඩ සටහනක් වුවත් මේ දේශපාලන බලය අයුතු ලෙස භාවිත කිරීම නිසා රටකට අත්වන විනාශය යි".

රටක සාමාන්‍ය පුරවැසියන්ට විත කරන, රට වනසන, අනීතික අයුරින් හැසිරෙන, රට ප්‍රපාතයකට ඇදගෙන ගිය දේශපාලනඥයන්ව පුරවැසි ඡන්ද බලයෙන් ඉවත් කළ යුතු නැද්ද ? එසේ කරන්නට ජනතාවට විචක්ෂණයක් හා විචාරශීලී දැක්මක් අත්‍යවශ්‍යය. එනම් හොඳ නරක අවබෝධකර ගැනීමට කෙනකු තුළ පහළ වන දැක්ම හෝ ප්‍රඥාවන්ත කමයි. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් මීට වසර ගණනාවකට ඉහත පද රචනය කළ ගී පද වැල් අදටත් කොපමණ ගැලපේද ?

"බුදුනේ, ජේසුනේ නබිනායක තුමනේ
නොමිනිසුන්හට මිනිසත්කම දුන මැනවි
මිනිසුන්හට ප්‍රාඥාව දුන මැනවි
ප්‍රාඥාවන්තයින් සිංහාසනාරූඪ කළ මැනවි"

රටේ අනාගතයට හිමිකම් කියන්නේ දරු පරම්පරාව සහ උපදින්නට නියමිත දරු පරපුරය. ඔවුනට සාධාරණත්වයක් ඉටු කිරීම අද ජීවත්වන සියලුම වැඩිහිටියන්ගේ පුරවැසි වගකීමක් පමණක් නොව අදහන දහමටද කරන සාධාරණත්වයකි. එය ආගමික යුතුකමකි.

**සංස්කාරක පියතුමා**

# සමිඳු කෙත සරු කළ කොළොම්පුර සහායක එබෑරාණනි ....



ස්වර්ගස්ථ වූ කොළඹ අගරදගුරු පදවි සහායක රදගුරු අති උතුම් මේරියස් පීරිස් හිමිපාණෝ දශක ගණනාවක් පුරා පූජක සහ රදගුරු සේවාවේ නිරතවෙමින් අති උසස් සේවාවක් අගරදගුරු පදවියට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකා කතෝලික සභාවටම ඉටුකළහ. හසළ දැනුමකින් පිරිපුන් දක්ෂ ගුරුවරයෙක්, ජන හදවත් දිනූ මීසම් සේවක පියතුමෙක්, විවිධ සඟරා, පුවත්පත්වලට ලිපි සැපයූ ප්‍රවීණ ලේඛකයෙක්ද වූ මෙතුමා ඉතා නිහතමානවද සරල ජීවිතයක් තුළ දිවි සැරිය නිමාවට පත් කළහ. එතුමන්ගේ දූත මෙහෙවර අමරණීයවේ. ඒ සියල්ල ඉතා කෘතවේදීව සිහිපත් කරමු. පසුගිය මැයි මස 13 දා සදහටම සමුගත් උන්වහන්සේට සගසුව පතමු.

# ගරු මර්ල් මෙන්ඩිස් නිමනි පියතුමා සගසුව දිනයි !



වියත් ලේඛකයකු, ප්‍රකට ධර්මදේශකයකු, උගත් ධර්මධරයකු හා 1989 සිට 1990 දක්වා භක්ති ප්‍රබෝධනය සඟරාවේ සංස්කාරක ධුරයද දැරූ ගරු මර්ල් මෙන්ඩිස් නිමනි පියතුමා පසුගියදා සගසුව දිනීය. 1941 ජනවාරි මස 16 වන දින මොරටුව කඩලානේ දී උපන් මෙතුමා, නිර්මල මරිය නිකායට බැඳී 1961 මැයි මස 31 වන දින ප්‍රථම වේදහාර පොරොන්දු ලබා දී 1968 සැප්තැම්බර් මස 28 වන දින පූජකවරම් ලැබීය. මීසම් සහායක පියතුමකු ලෙස සිය සේවා ජීවිතය ඇරඹූ ගරු මර්ල් මෙන්ඩිස් පියතුමා කැනඩාවේ විශ්වවිද්‍යාල කිහිපයකින් ජනසන්නිවේදනය හා වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ ගෞරව උපාධි ලබා එංගලන්තයේ ලන්ඩන් නුවර අධ්‍යාපන ආයතනයකින් ධර්මෝපදේශය පිළිබඳ විශේෂ ඩිප්ලෝමා පාඨමාලාවක්ද හැදෑරීය.


1984 වසරේදී මිනුවන්ගොඩ පොල්වත්ත නි.ම.නි. ජනසන්නිවේදන මධ්‍යස්ථානය (වර්තමානයේ දෙව් අරණ) ආරම්භ කොට එහි ප්‍රථම අධ්‍යක්ෂ ධුරය දැරූ මෙතුමා 1995 ජූනි මස 01 වන දින ධර්මෝපදේශ හා බයිබල් දූත සේවා ජාතික අධ්‍යක්ෂ ලෙස ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය විසින් පත්කරන ලදී. පසුව හංවැල්ල ගිරිදර නි.ම.නි. මධ්‍යස්ථානය අරඹා එහි පාසැල් ළමයින් සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ කටයුත්තේ නිරත විය. පුරා වසර 56 ක් තිස්සේ නිර්මල මරිය නිකායේ විවිධ දූත සේවාවල නියැලෙමින් නොමැකෙන සේවාවක් ඉටුකළ ගරු මර්ල් මෙන්ඩිස් පියතුමා මියයන විට 83 වන වියේ පසුවිය.


'භක්ති ප්‍රබෝධනය' සංස්කාරක පියතුමා ඇතුළු කාර්යමණ්ඩලය හා ලේඛක, පාඨක සියලු දෙන එක්ව ගරු මර්ල් මෙන්ඩිස් පියතුමාට ස්වර්ග සම්පත්තිය ප්‍රාර්ථනා කර සිටිති !

වී සුනිල් ප්‍රනාන්දු

# බලය පිළිබඳ කිතුනු දැක්ම







බලය යන වදන අපගේ දෙසවනට වැකෙත්ම මතකයට එන්නේ මානව සමාජය තුළ ජීවත්වන විවිධ පුද්ගලයන්, ශක්තිමතුන්, විවිධාකාර ක්ෂේත්‍ර ආශ්‍රිතව ප්‍රසිද්ධියක් උසුලන, මනුෂ්‍යයන් තුළ දැකිය හැකි දක්ෂතා කුසලතා, දැනුම් සම්භාරය, ධනය, වස්තුව, ඉඩකඩම් හා බද්ධ වූ ක්‍රියාරකම් සමුදාය පිළිබඳවයි. මෙය පොදු වශයෙන් කවුරුත් දනිති. විද්‍යාව (Science) සම්බන්ධව අපගේ අවධානය යොමු කර බලන විට මේ ආශ්‍රිතව ගම්‍ය වන කරුණක් පවතී. එය රඳා පවතින්නේ හුදෙක් යම් සීමාවක්, පද්ධතියක් පාදක කර ගනිමිනි.

විද්‍යාත්මක ඇසින් බලන කල බලය (Force) යනුවෙන් අදහස් කරන්නේ යම් වස්තුවක තිබෙන ද්‍රව්‍ය ප්‍රමාණය හෙවත් ස්කන්ධය (Mass) තවත් යම් කිසි දිශාවක් කරා ආකර්ෂණය කර ගනු ලබන ශක්තියයි. නිදසුනක් දෙස බලා මෙය අප අවබෝධ කර ගත යුතුය. යම් දෙයක් පෘථිවිය (Earth) වෙත ඇද ගනු ලබන හැකියාව, ගුරුත්වාකර්ෂණය ලෙස හැඳින්වීමට පුළුවන. යම් වස්තුවක පවත්නා බලය බෙදා දැක්වීමට හැකි බව සාමාන්‍යයෙන් අපට වැටහෙන කරුණක් වුවද, ඉතා ගැඹුරින් හා තාර්කිකව බැලූ විට තහවුරු වන්නේ එය බෙදිය නොහැකි බවත් සියලු අවස්ථාවලදී කේන්ද්‍රය වටා ඒකරාශිවී තිබෙන බවත් ය. ගණිතය (Mathematics) තුළ එය ස්කන්ධ කේන්ද්‍ර නියමය තුළින්ද නිරූපණය කරනුයේ, බලය සෑම විටම ස්කන්ධය තුළ කේන්ද්‍රගතවී පවතින බවයි.

දෙවියන්වහන්සේගේ පැවැත්ම පිළිබඳව සනාථ කරන ඇරිස්ටෝටල් (Aristotle) නමැති ග්‍රීක දාර්ශනිකයාද මෙය ඉතා පැහැදිලිව විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර තිබේ. ඔහු ස්වකීය අචල චාලක සංකල්පය (The Concept of Unmoved Mover) මගින් එය විග්‍රහ කර ඇත. එනම් දෙවියන්වහන්සේ (God) චලනය නොවී ස්ථාවරව සිට සෙසු වස්තූන් චලනය කරන බවයි. එය භෞතික විද්‍යාව (Physics) තුළින්ද විශද කරන්නකි.

මීළඟට අපගේ සැලකිල්ල මූලික ලෙසම යොමු විය යුතු වන්නේ අපගේ මුඛ්‍ය පරමාර්ථය වන බලය පිළිබඳ කිතුනු ආකල්පය කෙරෙහිය. ලොව පවත්නා සියලු බලවල උල්පත දෙවියන්වහන්සේ වන බව කිතු දහම (Christianity) අපට උගන්වන ප්‍රධාන යථාර්ථයකි. එය හුදෙක් අප නිර්වචනය (Definition) කරන බලයට වඩා හාත්පසින්ම වෙනස්, මිනිස් බුද්ධියේ නිම්වළලු අනන්ත අප්‍රමාණ වශයෙන් ඉක්මවා යන සංකල්පයක් වේ. එය අපට සීමා බන්ධන, පද්ධතිවලට වෙන්කළ නොහැක්කකි.

දෙවියන්වහන්සේට ආවේණික ඒ බලය, උන්වහන්සේ වටා ව්‍යාප්ත වී තිබෙන්නේ පිතා, පුත්‍රයා හා ශුද්ධාත්මයාණන් වහන්සේ වශයෙනි. දැල්වෙන ඉටි පහනක දැල්ලෙහි, රතු, නිල් හා කහ යන වර්ණ පැවතියද ඒවා දැකිය හැක්කේ එකම දැල්ලකය. එය ශුද්ධවූ ත්‍රිත්වය (The Blessed Trinity) මාර්ගයෙන්ද අපට තහවුරු කර දීමට පුළුවන. දෙවිඳුන් තමන්ට හිමි බලය මනුෂ්‍යයා (The Human Being) සමග බෙදා ගැනීමට කැමැති වූ බව උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය දෙස බලද්දී ගම්‍ය වේ. එලෙසම මෙලොව වෙසෙන සියලු මිනිසුන් උන්වහන්සේගේ මැවිලි වන අතර ඔවුන්ගේ ආරම්භයට තුඩුදී ඇත්තේ අපට නොපෙනෙන දේව සැලැස්මකි. දේව අභිමතයකි.

ලෝකයේ සකල මැවිල්ලේ මැවුම්කරුවණන් වන්නේ දෙවියන්වහන්සේය. මැවිලි වන අප, සෙසු මැවිලි වල අයිතිකරුවන් නොව භාරකරුවන් ය. ලෝකය ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම, මැවිල්ල වර්ධනය කිරීම, මැවිල්ල ව්‍යාප්ත කිරීම, මැවිල්ල පාලනය කිරීම උන්වහන්සේ විසින් අපට පවරා තිබෙන වගකීම් සමුදායයි. අප එය නොපිරිහෙළා, උද්යෝගයෙන්, සතුටින් ඉෂ්ට කළ යුතුය.

දෙවි සමිඳුන් තුළ ඇති බලයෙහි විශේෂත්වයක් ඇත. එනම් එහි අව්‍යාජ නායකත්වයක් අන්තර්ගත වී තිබීමයි. එය හුදු ඒකාධිපති, ආඥාදායක පාලනයක් නොව සේවක නායකත්වයක් (Servant Leadership) බැව් ඉතා හොඳින් අවබෝධ කර ගත යුත්තකි. එය මෙහිදී අවධාරණයෙන් සඳහන් කළ යුතු දෙයකි.

මිනිස් සමාජය (Human Society) තුළ නායකත්වයේ විවිධාකාර ප්‍රභේද පවතී. උන්වහන්සේ අපට ඉදිරිපත් කරන බලය තුළින් වෑහෙන නායකත්වය පාද සෝදන නායකත්වයකි. එනයින් ගම්‍ය වන්නේ සේවක නායකත්වය තුළින්, අප තුළ ආධ්‍යාත්මික ධනවත්කමක් ගම්භීරත්වය පෙන්නුම් කරන බවයි. මෙලොව වාසය කරන සැවොම බලය ගැනීමට රුචිකත්වයක් දක්වති. ඒ සඳහා ලුහු බඳිති. සියලු පහත් ක්‍රියා පවා කරති. එහෙත් ක්‍රිස්තුන්වහන්සේ වෙත නායකත්වය, බලය ලැබුණේ නිරායාසයෙනි. දේව අභිමතයට නතුවීමෙනි. එබැවින් උන්වහන්සේ යටහත් පහත් භාවයේ, නිහතමානත්වයේ පරමාදර්ශයයි. ප්‍රතිමූර්තියයි.

දෙවි සමිඳුන් අපට ලබාදී තිබෙන බලය, තනතුරු, කීර්තිය හුදෙක් මොනරපිලක්, කිරුළක් කර නොගත යුතුය. නිර්ව්‍යාජ බලය තුළ අන්‍යයන් උසස් කිරීමේ ගුණාංගය පැවැතිය යුතුය. මමත්වයෙන් ඈත්වන ප්‍රමාණයට ශුද්ධාත්ම අනුහසින් අපගේ සිත්සතන්, හදවත්, පැතුම් වසා ගනු ඇත. ඒ නිසා අප නිබඳව මහෝත්තම දෙවිපියාණන් වහන්සේට අවනත විය යුතුය.

මනුෂ්‍යයාට ලැබී තිබෙන බලය, දෙවි සමිඳුන් වෙතින් ලැබූ බව සිහිපත් කළ යුතුය. මිනිසා දෙවිඳාණන්ගේ බලයට අනුගත වන කල උන්වහන්සේ බහුල ලෙස අපට ශක්තිය, ප්‍රබෝධය, අස්වැසිල්ල, සන්තුෂ්ටිය දෙන සේක.

බලය ගැන සාකච්ඡා කරද්දී දේශපාලන බලය (Political Power) මනසට ගෝචර විය යුතුය. බලය පමණක් පදනම් කරගත් දේශපාලනය හෙවත් බල දේශපාලනය (Power Polotics) පිළිබඳවද සොයා බැලිය යුතුය. කිතුනු දේශපාලනය (Christian Politics) තුළ බල දේශපාලනය, කිතු දහම හා කිතුනු සභාව (Christian Church) ඉතා තරයේ ප්‍රතික්ෂේප කරයි. කිතුනු දේශපාලනයේ අඩිතාලම විය යුත්තේ තමාගේ යහපත ශුභ සිද්ධිය අමතක කොට ජනතාවට සේවය කිරීමයි. එකිනෙකාට සුබසෙත උදා කිරීමයි. එය අතිශයින් ඉතා ගැඹුරු දර්ශනයකි. දහමකි. ප්‍රායෝගික ක්‍රියාවලියකි.

නිර්ව්‍යාජ බලය (Real Force) තුළ දක්නට ලැබෙන්නකි, සංවේදිතාව (Sensitivity) සහ පරාර්ථකාමිත්වය (Unselfishness). මෙය යථාර්ථයක් බැව් පසක් කිරීමට ඉදිරිපත් කළ හැකි උදාහරණයක් තිබේ. එනම් ක්‍රිස්තුන්වහන්සේගේ අමිල (Priceless) ජීවිත පූජාවයි. එදා 12 වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා ඉදිරිපත් කළ සත්‍යතාවක් සඳහන් කිරීමට පුළුවන. එනම් ආගමෙන් තොරව, ආගමෙන් බැහැරව ජනතාවට සේවය කිරීමට පවතින්නේ දේශපාලනය වන බවයි.

මහත්මා ගාන්ධි, මාර්ටින් ලූතර්, ඩෙස්මන්ඩ් ටු ටූ, සෙබස්තියන් කප්පේන්, ඔස්කා රොමෙයිරෝ බඳු ජීවන චරිත ඇසුරෙන් බලය තුළ පවත්නා නිර්ව්‍යාජත්වය, නිහතමානත්වය ප්‍රත්‍යක්ෂ කළ හැකිය. එපමණක් නොව පුවත්පත් කලාවේදීන්ගේ හා ග්‍රන්ථ කර්තෘවරුන්ගේ ආරක්ෂක මුනිවරයා ලෙස පිදුම් ලබන, නීතිඥයෙක්, රදගුරුවරයෙක්, ලේඛකයෙක් හා දේශාපාලනඥයෙක් වන ශුද්ධවර ෆ්‍රැන්සිස් සාලෙස් මුනිතුමාද කිතුනු දේශපාලනයේ උදාරත්වය වටහාගත් උත්තමයෙකි. යුග පුරුෂයෙකි. එතුමාගේ දිවි පෙවෙත තුළින්ද අපට එය ගම්‍ය කිරීමට පුළුවන. මෙලෙස බලන කල අපට තහවුරු වන්නේ බලය තුළ විවිධාකාර පැතිකඩ, ක්ෂේත්‍ර රාශියක් ඇති බවයි. එය කිතුනු දහම තුළ බලය විශ්ලේෂණය කරන ආකාරයයි.

**මලින්ත බෝපෙආරච්චි**
දලුගම, කැලණිය.

# දෙවියන්වහන්සේට වඩා නපුර බලවත් ද?

නපුර යනු අතීතයේ සිටම මානව සංහතියේ විඥානය තුළ හොල්මන් කළ සංකල්පයක් වන අතර එය ඉතිහාසයේ විවිධ යුග සහ සමාජයේ ව්‍යුහය පුරා පැතිරී ඇත. එය යුද්ධයේ සහ ප්‍රචණ්ඩත්වයේ බිහිසුණුකමේ සිට වංචාවේ සහ පාවාදීමේ නිහඬ කටහඬවල් දක්වා අසංඛ්‍යාත ස්වරූපවලින් විදහා දක්වයි. එහි පැවැත්ම ප්‍රතික්ෂේප කළ නොහැකි ය. එහි බලපෑම් ගැඹුරු ය. එහි මූලාරම්භය ගැඹුරින් ව්‍යාකූල වේ. ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑරම, මිනිස් පැවැත්මේ සෑම යුගයකම, නපුරේ සෙවණැල්ල විශාල වේ. එය ප්‍රජාව විනාශ කරයි, ජීවිත විනාශ කරයි, සහ විනාශයේ මාවතක් ඉතිරි කරයි. කුරිරුම පීඩාකාරී ක්‍රියාවල සිට හෘදය සාක්ෂියේ කුඩාම උල්ලංඝන දක්වා එහි බලපෑම බොහෝ දුරට දැනේ. කාරුණික හා සර්වබලධාරී දෙවියන් විසින් නිර්මාණය කරන ලද ලෝකය එවැනි අන්ධකාරයක් රඳවා ගන්නේ කෙසේද? මේ ප්‍රශ්නය සියවස් ගණනාවක් පුරා දේවධර්මවාදීන්, දාර්ශනිකයන් සහ ගවේෂකයන් එකසේ ප්‍රහේලිකාවට ලක් කර ඇති අතර, එය බොහෝ විට "නපුරේ ගැටලුව" ලෙසින් හඳුන්වනු ලබයි. ක්‍රිස්තියානි සම්ප්‍රදාය තුළ, නපුරේ යථාර්ථය සමඟ පොරබැදීම හුදෙක් බුද්ධිමය අභ්‍යාසයක් නොව ඇදහිල්ලේ මූලික අංගයකි. එය ඇදහිලිවන්තයන්ට දිව්‍ය ස්වෛරීත්වය, මානව නිදහස සහ පාපයේ ස්වභාවය යන සංකීර්ණතාවලට මුහුණ දීමට බල කරන අභියෝගයකි.

දේවධර්මීය විමසුමේ අභ්‍යන්තරයේ ඇත්තේ ගැඹුරු පරස්පර විරුද්ධත්ත්වයකිඃ කරුණාවන්ත සහ සර්වබලධාරී දෙවියන්වහන්සේ ලෝකයේ නපුරේ පැවැත්ම සමඟ සහජීවනයෙන් සිටින්නේ කෙසේද? ක්‍රිස්තියානි සන්දර්භය තුළ, මේ අවුල ඇදහිල්ලේ හරයට පහර දෙයි, දෙවියන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සමඟ නපුරේ පැවැත්ම සමථයකට පත් කිරීමට ඇදහිලිවන්තයන්ට අභියෝග කරයි. අසීමිත යහපත් හා ප්‍රේමණීය ලෙස විස්තර කරන ලද දෙවි කෙනකුට දුක් වේදනා සහ අයුක්තිය දිගටම පැවතීමට ඉඩ දෙන්නේ කෙසේද? දෙවියන්වහන්සේ සැබවින්ම සර්වබලධාරි නම්, මනුෂ්‍යත්වයට පීඩා කරන අසංඛ්‍යාත ම්ලේච්ඡ ක්‍රියා වැළැක්වීමට උන්වහන්සේ මැදිහත් නොවන්නේ මන්ද? මේ දෙවියන්- වහන්සේගේ යහපත්කම සහ නපුරේ යථාර්ථය අතර ආතතිය පහසුවෙන් විසඳිය නොහැකිය. එය මිනිස් අවබෝධයේ සීමා සහ දිව්‍යමය ප්‍රතිපත්තිවල සංකීර්ණතා සමඟ පොරබඳන්නට අපට බල කරයි. එහෙත්, මේ ආතතිය තුළ ඇදහිල්ලේ අභිරහස් ගැඹුරින් සොයා බැලීමට සහ සැකයේ සෙවණැලි අතර අවබෝධය සෙවීමට ආරාධනාවක් ඇත. අවිනිශ්චිතභාවය මධ්‍යයේ වුවද, දෙවියන්වහන්සේගේ අරමුණු අපගේ සීමිත අවබෝධය ඉක්මවා යයි යන බලාපොරොත්තුවෙන් කිතුනු අප සැනසීමක් ලබයි.

එහෙත්, නපුර හමුවේ දෙවියන්වහන්සේගේ බලය පිළිබඳ ක්‍රිස්තියානි දර්ශනය ඉදිරියේදී සම්පූර්ණයෙන් ග්‍රහණය කර ගැනීමට නම්, අප ප්‍රථමයෙන් තේරුම් ගත යුතු වන්නේ දෙවියන් වහන්සේ ලෝකය තුළ නපුරේ පැවැත්ම අක්‍රිය කර නැති බවයි. යහපත් සර්වබලධාරී දෙවියන් නපුර පවතින්නට ඉඩ දෙන්නේ මන්දැයි යන ප්‍රශ්නය ක්‍රිස්තියානි දේවධර්මයේ ගැඹුරු හා සංකීර්ණ ප්‍රශ්නයකි. කිතුනුවන් වන අප විශ්වාස කරන්නේ දෙවියන්වහන්සේ නපුරට අවසර දීම නිදහස් කැමැත්ත යන සංකල්පයට ගැඹුරින් සම්බන්ධ වී ඇති බවයි. බයිබලයට අනුව, දෙවියන්වහන්සේ මිනිසුන්ව මැව්වේ යහපත සහ අයහපත අතර නිදහසේ තෝරා ගැනීමේ හැකියාව ඇතිවය. මේ නිදහස් කැමැත්තේ තෑග්ග අව්‍යාජ ආදරය සහ සදාචාරාත්මක වගකීම සඳහා අත්‍යවශ්‍ය වේ. තෝරා ගැනීමේ හැකියාවක් නොමැතිව, දෙවියන්වහන්සේට සහ එකිනෙකාට අපගේ

ප්‍රේමය අර්ථ විරහිත වනු ඇත. උත්පත්ති 3 හි දක්නට ලැබෙන වැටීම පිළිබඳ බයිබලානුකූල ආඛ්‍යානය, ලෝකයට නපුර ඇතුළු වූ ආකාරය නිරූපණය කරයි. මුල් මනුෂ්‍යයන් වූ ආදම් සහ ඒව දෙවියන් වහන්සේට අකීකරු වීමට තීරණය කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පාපය සහ දුක් වේදනා මිනිස් අත්දැකීම්වල කොටසක් බවට පත් විය. මේ අකීකරු ක්‍රියාව දෙවියන්ව පුදුමයට පත් කළේ නැත. ඒ වෙනුවට, නපුරේ සහ දුක් වේදනාවල යථාර්ථයට මඟ පෑදුණද, මිනිසුන්ට තෝරා ගැනීමේ නිදහස දීම උන්වහන්සේගේ පරමාධිපත්‍ය සැලැස්ම තුළ විය.

දෙවියන් වහන්සේ නපුර අක්‍රිය නොකළත්, කිතුනුවන් වන අප විශ්වාස කරන්නේ අප ස්වෛරී සහ නෛසර්ගිකව යහපත් ලෙස පවතින බවයි. රෝම 8:28 ඇදහිලිවන්තයන්ට සහතික කරන්නේ "දෙවියන්වහන්සේ සැම දෙයකදීම ක්‍රියා කරන්නේ උන්වහන්සේට ප්‍රේම කරන, උන්වහන්සේගේ අරමුණට අනුව කැඳවනු ලැබූ අයගේ යහපත පිණිසය." මෙයින් අදහස් කරන්නේ අයහපත ඉදිරියේ පවා දෙවියන් වහන්සේගේ මිදීමේ බලය ක්‍රියාත්මක වෙමින් යහපත ගෙනෙන අතර අපගේ දිව්‍ය අරමුණු ඉටු කරන බවයි. ලෝකයේ නපුර පවතින බව තේරුම් ගැනීමට නිදහස් කැමැත්ත මූලික වේ. මනුෂ්‍ය වර්ගයාට නිදහස් කැමැත්ත දීමට දෙවියන්වහන්සේ ගත් තීරණය, උන්වහන්සේගේ මැවිල්ල සමඟ අව්‍යාජ සම්බන්ධතාවක් සඳහා උන්වහන්සේගේ අභිලාෂය අවධාරණය කරයි. ආදරය, අව්‍යාජ වීමට නම්, නිදහසේ තෝරා ගත යුතුය. අවාසනාවකට මෙන්, මේ නිදහස අනිසි ලෙස භාවිත කිරීම සදාචාරාත්මක නපුරට අප යොමු කරයි. එමෙන්ම හානි හා දුක් වේදනා ඇති කරන ක්‍රියා අත්දකින්නට සලස්වයි. කෙසේ වෙතත්, නිදහස් කැමැත්ත නොමැතිව, මිනිසුන් හුදු ස්වයංක්‍රිය, සැබෑ ආදරයට හෝ සදාචාරාත්මක වර්ධනයක් නොමැති රොබෝවරුන් වනු නොඅනුමානය.

කිතු දහම අපට උගන්වන්නේ අපගේ දුක් විඳීම තුළින් දෙවියන්වහන්සේ මිදීමත් ප්‍රවර්ධනයත් ඇති කරන බවයි. පැරණි ගිවිසුමේ ජෝසප්, ඔහුගේ සහෝදරයන් විසින් වහල්භාවයට විකුණනු ලැබූ අතර පසුව ඊජිප්තුවේ බලයට පත් වූ කතාවෙන් මේ මූලධර්මය විදහා දක්වයි. උත්පත්ති 50:20 හි ජෝසප්ගේ වචන මේ සත්‍යය ග්‍රහණය කරයි: ඔබ නම් මට විරුද්ධ ව නපුරුකම් සිතුවහු ය. එහෙත් අද සිදු වී තිබෙන පරිදි, දෙවියන්-වහන්සේ බොහෝ මිනිසුන්ගේ ජීවිත ගලවනු පිණිස ඒවා යහපතට හැරවූ සේක. දුක් වේදනා තුළින් ඇදහිලිවන්තයන්ට දෙවියන්වහන්සේගේ පරිවර්තනීය බලය අත්විඳිය හැකි අතර උන්-වහන්සේ වෙතට සමීප විය හැකිය.

කිතුනු අපගේ බලාපොරොත්තුව නපුර මුළුමනින්ම පරාජය කිරීමයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මරණය සහ නැවත නැඟිටීම මේ විශ්වාසයේ කේන්ද්‍රය වේ. උන්වහන්සේගේ ජීවිත පූජාව තුළින්, ජේසුස් වහන්සේ පාපය සහ මරණය ජයගත් අතර, විශ්වාස කරන සියල්ලන්ට සදාතන ජීවනයට මාර්ගයක් ලබා දුන්සේක. එළිදරව් 21:4 අනාගතය පිළිබඳ දර්ශනයක් ඉදිරිපත් කරයි, එහිදී දෙවියන්වහන්සේ ඔවුන්ගේ දෙනෙතින් සියලු කඳුළු පිසදමන සේක. මරණය තවත් නැත. වැලපීම ද හැඬීම ද, වේදනාව ද තවත් නැත. ඒ පළමු පිළිවෙළ පහ ව ගිය බැවිනි." මේ පොරොන්දුව කිතුනුවන් වන අපට සහතික කරන්නේ අවසානය නපුරාගේ ආධිපත්‍යය තුළ නොමැති බවයි.

අවසාන වශයෙන්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාධිපත්‍යය තුළ නපුරේ පැවැත්ම අක්‍රිය නොකළත්, උන්වහන්සේ කිතුනුවන් වන අපට එයට එරෙහිව සටන් කිරීමේ බලය සහ වගකීම සන්නද්ධ කර ඇත.

11 වන පිටුවට ....

**ගරු නිලූෂන් ප්‍රනාන්දු පියතුමා නිමනි**
අධ්‍යක්ෂ, නිමනි දේශනාවාදි පැවිදි සංඝය,
'නාසරෙත්', වෙන්නප්පුව.

# ශුද්ධාත්ම බලය තුළ බලවත් වෙමු

බලය විවිධාකාරය. ලෞකික බලය දෙපැත්ත කැපෙන තියුණු ආයුධයක් හා සමානය. මන්ද බලය අනිසි ලෙස භාවිත කළහොත් තමාත් කැපී අනිකාත් කැපී සියල්ලෝම වැනසී යන්නාහ. දේශපාලන බලය, මුදල් බලය, මැර බලය, තනතුරු බලය වැනි බල නිසා මිනිස් සිත දූෂණය වෙයි. මේ බල තුළින් පිම්බී සිටින අය නිරතුරුවම හිස උදුම්වාගෙන අහංකාර පරවශව දිවි ගෙවති. ඔවුන් තුළින් මිනිස් ගුණධර්ම මැකී යයි. තිරිසන් ගතිගුණ මතුවෙයි. සියල්ලෝම නොව වැඩි දෙන එලෙස දූෂිත වූ අය වන්නාහ. එවන් පුද්ගලයන් හට කරුණුකාරණ කියා දීම ද කළ නොහැකිය. ඒවා සඳහා ඔවුන්ගේ දෙසවන් බිහිරි වී ඇත. එසේම බල ලෝභයද දරුණු ලෙස මිනිස් සිත දූෂණය කරයි. එකෙක් මරා හෝ තම අභිලාෂ මුදුන් පමුණුවා ගැනීමට බොහෝ දෙනා උත්සාහ දරනු ඇත.

එහෙත් කිතුනුවන් වශයෙන් අපි ආත්මීක බලය ගැන කථා කළ යුත්තෙමු. ක්‍රිස්තුස් වහන්සේට පවා උන්වහන්සේගේ මෙලොව ක්‍රියා සඳහා යම්කිසි බලයක් අනුභාවයක් අවශ්‍ය විය. ඒ බලය නිකුත් වූයේ කොතැනකින්ද? කාගෙන්ද? අපි විමසා බලමු. ක්‍රිස්තුස් වහන්සේ මෙලොව ජනිත වීමටත් පෙරාතුව සිටි යෙසායා දිවැසිවරයා මෙලෙස කියා ඇත. "මහෝත්තම දෙවි සමිඳුන් ගේ ආත්මානුභාවය මා කෙරෙහි පිහිටා ඇත. දිළිඳුන්ට සුබ අස්න දෙසීමටද, බිඳුණු සිත් ඇත්තන්ට සුව සෙත දීමටද ........ එතුමාණෝ මා ආලේප කළ සේක" (යෙසායා 61:1).

ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරද්දීම ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ලබාගත් බව අපට ශු. ලූක්තුමා මෙසේ පෙන්වා දෙයි. "ශුද්ධාත්මයාණෝ පරවියකුගේ රූපාකාරයෙන් උන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක" (ලූක් 3:22). "ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණව ජොර්දානෙන් ආපසු ආවිට ....."(ලූක් 4:1). "තවද ජේසුස් වහන්සේ ශුද්ධාත්මානුභාවයෙන් යුක්තව ගලීලයට පෙරළා වැඩිය සේක" (ලූක් 4:14).

මෙයින් අපට පැහැදිලි වන්නේ ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරද්දීම ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පූර්ණ වූ බවයි. සමිඳාණන් හට එළඹුණාවූ යක්ෂ පරීක්ෂා ජය ගැනීම සඳහා ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය උපකාරී වූ බව අපට සිතිය හැකිය.

ක්‍රිස්තුස් වහන්සේ අහස් නැගීමට ප්‍රථම රැස්වූ ගෝලයන් හට කියන ලද්දේ කුමක්ද? ඒ වදන් එදා මෙන් අදටත් අද මෙන් හෙටටත් ජීවත් වෙන ශ්‍රේෂ්ඨ වදන් ය. "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහුය. එවිට ඔබ ..........පොළොවේ සීමාන්ත දක්වා මාගේ සාක්ෂි කාරයෝ වන්නාහුය" (ක්‍රියා 1:8). මේ දිව්‍යමය බලය අපට ප්‍රේමය, ප්‍රීතිය, ඉවසීම ආදි සැම යහ ගුණයක්ම උගන්වනු ඇත. එසේම දුක් විඳීමේ, දරා ගැනීමේ හැකියාවද දෙනු ඇත. "දෙවියන්වහන්සේ අපට දුන්නේ බියාදු ගතිය නොව බලසම්පන්න, ප්‍රේමාන්විත, හික්මුණු ආත්මානුභාවයකි" (2 තිමෝති 1:7).

දුර්වලතා, අවශ්‍යතා, අපහාස, පීඩා මැද ශක්තිමත්ව දෙපයින් නැගී සිටීමට බලය අපට ලැබෙන්නේ ශුද්ධාත්ම බලයෙනි. "මාගේ බලය පරිපූර්ණ වන්නේ දුර්වල කමේදී බැවින් මාගේ වරප්‍රසාදය ඔබට සෑහේ යයි වදාළ සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වල කම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. ....... දුර්වලව සිටියදී මම ශක්ති සම්පන්නව සිටිමි" (2 කොරින්ති 12:9-10). ශුද්ධවූ පාවුලු තුමා බලය ගැන මෙලෙස තිමෝතියස් තුමාට කියයි.

"දෙවියන්වහන්සේ අපට දුන්නේ, බයාදු ගතිය නොව, බල සම්පන්න, ප්‍රේමාන්විත, හික්මුණු ආත්මානුභාවයයි" (2 තිමෝති 1:7).

ශුද්ධාත්ම බලය අප තුළ ක්‍රියාත්මක වෙද්දී අප සිත් තුළ ප්‍රීතිය ප්‍රේමය සමාදානය පැන නගිනු ඇත. ආදරයෙන් අප තෘප්තිමත් වනු ඇත. අප සිත් තුළ ඇති සැක සංකා දුරුවනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ සුබාරංචියේ වචන-වලට ඇති බලය ගැන අප සොයා බැලුවාද? එහි එන ශුද්ධවූ වචන වලට මහත් බලයක් ඇතිබව ඔබ අත් දුටුවාද? ඒ වචන තුළින් ඔබ චිත්ත ප්‍රීතිය ලැබුවාද? මේ කරුණු ඔබ අත්දැක්කා නම් ඒ ශුද්ධවූ වචනවලට මහත් බලයක් ඇති බව ඔබටම දැනෙනු ඇත. ඒ වචනවලින් ධ්වනිත වන අදහස් දෙවියන් වහන්සේගේම අදහස් බැවින් ඒවා අති පරිශුද්ධය. ඒ වචනවලින් නැගෙන අදහස් මනුෂ්‍යයන් වන අප වෙත පැමිණෙන්නේ ශුද්ධාත්ම බලයෙනි. මේ මුළු මහත් ලෝකයටම අද අවශ්‍ය වන්නේ සාමයයි, ප්‍රේමයයි, ප්‍රීතියයි. ඒවා ලැබීමට සුබාරංචියේ ශුද්ධවූ වදන් මහෝපකාරී වනු ඇත. අපගේ ජීවිතයට අවශ්‍ය බලය, ශුද්ධවූ වචනවලින් ලබනවා නම්, නිසැකවම අපි පරිශුද්ධ වන්නෙමු. දේව වචන අප සිත් තුළින් ක්‍රියාත්මක වෙනවා නම්, අපගේ ජීවිත තුළින් දෙවියන්වහන්සේව ලෝකයාට පෙන්නුම් කෙරෙනු ඇත.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

9 වන පිටුවෙන් ....

නපුර මුලිනුපුටා දැමීමට සෘජුව මැදිහත් වෙනවා වෙනුවට, දෙවියන් වහන්සේ තම අනුගාමිකයන්ට උන්වහන්සේගේ මිදීමේ සැලැස්මේ ක්‍රියාකරුවන් වන්නට ආරාධනා කරති. ජීවිතයේ සෑම අංශයකම ප්‍රේමය, යුක්තිය සහ දයානුකම්පාව මූර්තිමත් කිරීම, ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ජීවත්වීම මෙයට ඇතුළත් වේ. කිතුනුවන් වන අප විශ්වාස කරන්නේ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන නපුරට මුහුණ දීමට සහ ඒවා ජය ගැනීමට අවශ්‍ය ශක්තිය සහ මග පෙන්වීම අපට ලැබෙන බවයි. මේ දිව්‍යමය බලගැන්වීම ඇදහිලිවන්තයන් වන අපට අයුක්තියට එරෙහිව නැගී සිටීමට, දුක් වේදනා සමනය කිරීමට සහ බලාපොරොත්තුවේ සහ මිදීමේ පණිවිඩය පතුරුවා හැරීමට හැකියාව ලබා දෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය ලෙස එකට ක්‍රියා කිරීමෙන්, කිතුනුවන්ට අත්‍යවශ්‍ය ලෝකයක දෙවියන් වහන්සේගේ ප්‍රේමය සහ කරුණාව පිළිබිඹු කරමින් ප්‍රත්‍යක්ෂ බලපෑමක් කළ හැකිය.

මේ අනුව, කිතුනුවන් වශයෙන්, දෙවියන් වහන්සේ අපට නපුර ජය ගැනීමට බලය දී ඇති බව අපි විශ්වාස කරමු. මේ සටනේදී අපගේ මූලික ආයුධය දෙවියන් වහන්සේ කෙරෙහි අපගේ නොසැලෙන විශ්වාසයයි. අපගේ ශක්තිය සහ රැකවරණය ලෙස අපි දෙවියන් වහන්සේ මත රඳා සිටින විට, කිසිම නපුරකට අපට විරුද්ධව නැගී සිටිය නොහැකිය.



# පාරාවළල්ලක් නොවිය යුතු බලය

බලය සඳහා බටහිර, පෙරදිග විවිධ හැඳින්වීම් ඇතත්, එහි පරාසය දෙවිඳුන්ගේ ප්‍රඥාව මගින්ම පමණක් තේරුම් ගත යුතු සත්‍යතාවකි. විද්‍යාත්මකව නිව්ටෝරියානු නියම වලින් භෞතික විද්‍යාවේදී බලය නිර්වචනය කරන්නේ යම් ස්කන්ධයක් තිබෙන ස්ථානයෙන් විස්ථාපනය කළ හැකි ශක්තිය බලය ලෙසයි.

විද්‍යාවේදී අප සතු බලය, තාරකා විද්‍යාව ඔස්සේ කිලෝමීටර් බිලියන ගණනක් ඔබ්බටද ලබා ඇත. එය දෙවියන්ගේ බලය හා සංසන්දනය කළ නොහැකිය. දෙවියන්ගේ බලය සමහරු විද්‍යාවේදී උපහාසයට බඳුන් කරන අවස්ථා මා, විද්‍යා විෂයයේ නිරත අයකු නිසා අත්දැක තිබේ. එසේ නම් දෙවිඳුන්ගේ බලය හා මනුෂ්‍ය බලය අතර වෙනස කුමක්ද ?

සර්ව බලධාරී හා සර්වජන ඡන්ද බලය කවරේද? සර්ව බලධාරී යනු අපට හැඟෙන සියලුම ආකාරයේ බල ද අප නොදත් පරාසයක බල පද්ධති ද ඇති අපේ විශ්වාසය අනුව එක් කෙනෙකි. එහෙත් ඡන්ද බලය යනු එකිනෙකාගේ නිදහස් කැමැත්ත මූලික කරගෙන ප්‍රකාශවන ප්‍රජාවකට අතිශය වැදගත් දෙයකි. අපගේ ඉගැන්වීම් පරිදි අපට අයත් නිදහස් කැමැත්ත හෝ එකිනෙකාට පවතින එකිනෙකා මත්තේ වූ අධිකාරී බලය දෙවිඳුන්ගෙන් ලද තිළිණයකි. මෙය අප පිට නොපවතින්නේ නම්, අප දෙවිඳුන් මැවූ තවත් රොබෝ කෙනකු පමණි. නිදහස් කැමැත්ත දෙවිඳුන්ගේ ප්‍රඥාවට බද්ධ වී ඇති තාක් අප නීරෝග වන අතර, එය ශුද්ධාත්ම බලය හා ආගමනය තුළ මහා බලයක් වී, ලෙඩ සුවකිරීම, අන්‍ය භාෂා කථාකිරීම, යක්ෂයන් එලවීමේ බලය වැනි විද්‍යාව හා මනුෂ්‍ය ධාරිතා ඉක්මවා ගිය බලයක් ඇති වනු ඇත.

මේ සියල්ල, මහෝත්තම දෙවිසමිඳාණන්ගෙන් අප ලැබූ වරප්‍රසාද වන අතර බව්තිස්ම ස්නාපනය තුළ පවතින කැඳවීම් ශුද්ධවූ කතෝලික සභාවේ සැම කෙනකුටම උරුම වේ. මීට අමතරව පාප උච්චාරණය සහ දිව්‍ය සත්ප්‍රසාද අති විශේෂ ලෙස කතෝලික අප නිරන්තර බලගැන්වීමේ නිරත වේ. එහෙත් බලය නැති වේද ? දෙවිඳුන්ගේ බලය ඉතා අවතක්සේරු කරන ඇත්තෝ වාසි තකා විවිධ කඳවුරුවලට යාම කරති.

එසේ යාම තුළ අපගේ දෙවිඳුන් සමඟ වූ ගිවිසුම බිඳී යන අතර, යක්ෂයාගේ බලය වෙතට අප අපවම පාවා දෙනු ලබන බව කතෝලිකයන්ට බොහෝවිට අමතක වේ. එය ඉතා භයානක පාප ප්‍රස්තාවක් වන අතර ඉන් ඇතිවන සංකූලතා නැවත සිත් හැරී සැබෑ මනස්තාපයක් වන තුරුම ඇති ව්‍යාකුලතාවයකි. මෙයින් අප අත්‍යන්ත දේව ආදරයට පිටුපාන අතර, යක්ෂ බලය පිළිගැනීමකි. උක්ත කරුණු ඉතා ගැඹුරු අතර මීට අමතරව අප සමාජය තුළ කතෝලික දේශපාලකයන්ගේ බලයෙන් ඵලය කුමක්ද ? මෙය බොහෝ දෙනකුට ගැටලුවකි. සභාවට එක් දෙයක් පවසන මේ ඇත්තන් ප්‍රසිද්ධියේ තව එකක් කරන, බොරුව ආගම කරගත් භෞතිකවාදීන් මිස, අධ්‍යාත්මයක් හිමි කතෝලිකයන් නොවේ. මොවුන් කතෝලිකයන් ලෙස පල්ලියට එන්නේ දේශපාලන වාසියකට පමණි. ඔවුහු දෙවියන් දුන් නිදහස් කැමැත්ත, ඡන්ද පොලේදී සාතන් විලසින් මංකොල්ල කා ලබා අවුරුදු 5 ක් යනතුරුම තම අභිමතය හා උන්නතිය පමණම සලකා ක්‍රියා කරන්නෝය.

මේ දේශපාලනය හා බලය මහජන උන්නතියට නොයොදවන අයව හඳුනා ගැනීමට ප්‍රඥාවන්තකම ලාංකික අපට නොමැත්තේ ඇයි? එය එසේ වුවත් බටහිර රටවලට හා ජපානයට, දකුණු කොරියාවට ඇත්තේ ඇයි ? එය අපට නොමැති හේතුව අප ගැඹුරින් පර්යේෂණ කළ යුතුව ඇත.

බලය හා එය ක්‍රියාකරවන යන්ත්‍රණය

දුර්වලතා ඉතා විශාල ඇයි ? ඇමරිකාව වැනි රටක, ඉතා ධනවතුන් වන්නේ ඉතා මහන්සියෙන් වැඩ කරන, ඉතා ඉහළ උගත්කමක් ඇති අය වෙති. එහෙත් ලංකාවේ සමහර අතී ධනවතුන් තමා මුදල් උපයාගත් ආකාරය පවා හෙළිකිරීමට කරුණු නැති සුපිරි මිනිසුන් ය. මෙවන් රටක දේශපාලකයන්ට ඉහළ ප්‍රයෝගකරුවන් වීමේ වැඩි ඉඩක් ඇත්තේ ලාංකික බල යන්ත්‍රණය ඉතා දූෂිත මෙන්ම අධ්‍යාත්මයක් නොමැති නිසාය.

තවද අධ්‍යාත්මයෙන් තොර වස්තු සම්පත්, සෞභාග්‍යය හෝ ඒ හා අත්‍යන්තයෙන් බැඳුණු බලය රටකට ප්‍රජාවකට අහිතකරය. මේ අවස්ථා නැති කරගන්නේ කෙසේද? එය සොදොම් ගොමෝරා විනාශ කිරීමට පෙර නෝවා ඇසූ ප්‍රශ්නය වැනිය. එහි ධර්මිෂ්ඨයෝ කොපමණ සිටිත්ද ? එය අප සමාජයෙන්ද ඇසිය යුතු මූලික පැනයකි.

දෙවිඳුන් හට සැබෑ ගරුබිය පාන මනුෂ්‍යයන් අප අතර ඉහළ යත්ම අප රට නැවත කිරියෙන් පැණියෙන් ඉතිරෙන දේශයක් වනු ඇත. එහෙත් ඔබ, මම යුක්ති සහගත වන තුරු එය ඉෂ්ට නොවේ. එසේ වූ පසු දෙවියන්-වහන්සේ රජවරුන් හෝ අප නායකයන් ආලේප කළ යුතු වෙති. ඒ ආලේපයට එදා දාවිත්ව තෝරා ගත්තා සේ අප අතුරින් අය තෝරා ගන්නා දවස පැමිණිය හැකිය. ඔවුන් සැබෑ දියසෙන් මෙන් බලය මත්තේ මෙත් බලය වපුරා ප්‍රජාව සනසනු ඇත.

එතෙක් අප මනස්තාපනය වෙමු. සිත් හැරෙමු. සුබාරංචිය යනු මෙයයි. නිනිවයට අකමැත්තෙන් ගිය ජෝනාගේ පණිවුඩය එයයි. අප රටේ බලය සාතන්ගෙන් රැගෙන සැබෑ දෙවිඳුනට බාර කරමු.

ශල්‍ය වෛද්‍ය සචිත මෙන්ඩිස්
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරි
උ. කො. ශික්ෂණ රෝහල - රාගම

# බලය

මා ජීවිතයේ මාවත් වටලා
සතුරන් දහසක්
කඳවුරු බැඳ සිටියත්
ඒ කිම්දයත් දෙවිඳුන්ගේ
ශ්‍රී හස්තයෙන් මා ඉන්
රක්ෂා කරන බැවිනි.
වචනවලට බලයක් ඇත.
ඉන් ජීවිතයක් නසින්ටද පුළුවන.
යාච්ඤාවට බලයක් ඇත.
ඉන් ජීවිතයක් ගොඩනඟන්නට පුළුවන.

ශ්‍රී වචනයාණන් මාංසගතවී
මරිමවී තුළද වූයේ,
විශ්වාසයේ බලය වේ.
සුරැකි ජුසේ පියාණන් තම
සැරයටිය කරගනු ලැබුවේ,
තිර ඇදහිල්ල ය.

එහෙත් අද නම් බලය
බාල්දු වන්නේ,
මිනිස් චින්තනයේ වූ
වංක අධර්මිෂ්ඨ,
ක්‍රියා හා චේතනා ඉදිරියෙනි.

සිතද, කයද,
වචනයද, ක්‍රියාවද
පරමෝත්තම පියා වූ
අබ්බා පියාණන්ටද,
ලෝකාග්‍ර වූ පුත්‍රයාණන්ටද,
පරිශුද්ධ වූ ආත්මයාණන්ටද,
භාර කරන්න. එවිට,
ජීවිතය සාර්ථක වී
බලයෙන් පිරෙනු ඇත.

රාෂාරා මෙත්මි - මොරටුව

# ආගම උපකරණයක්

ආගම් විශාල සංඛ්‍යාවක් ලෝකයේ තියෙනවා. ඒ හැමෙකක් ම උපකරණයක් මිසක් දෙවියන් වහන්සේ හෝ දහම නෙවෙයි.

තක්කඩි දේශපාලනයට එරෙහිවීමට ආගම්වලට ප්‍රබල හැකියාවක් තියෙනවා. එමෙන්ම තක්කඩි බලකාමීන් ආගම උපයෝගි කර ගන්නවා දේශපාලන බලය ඩැහැගැනීමට සහ පවත්වාගෙන යාමට. මනුෂ්‍යයන් තුළ සිටින සාතන් ආගම උපයෝගි කරගන්නවා, දිවැසියන්ව සහ බෝධිසත්වයන්ව ඝාතනය කිරීමට සහ ඒ ඝාතන, සාධාරණ කිරීමට.

ජේසුස් වහන්සේ, ඇලෙක්සැන්ඩ්‍රියා විද්‍යාඥවරිය, බෲනෝ පූජකතුමා, සොක්‍රටීස් පඬිතුමා ආදීන්ව ඝාතනය කෙරුණේ ආගම ආරක්ෂා කර ගැනීමේ නාමයෙන්. ආගමේ නාමයෙන් බොහෝ යුද්ධ සහ කුරිරු මිනිස් ඝාතන සිදු වී තියෙනවා. ඉස්ලාම් අන්තවාදීන් ආගමේ නාමයෙන් මරාගෙන මැරෙනවා. අද ඇෆ්ගනිස්ථානය වැනි රටවල ආගමේ නාමයෙන් මනුස්සකම යටපත් කර අමනුස්සකම රජ කෙරෙනවා.

තමන් තුළ ශාස්තෘ ගුණ මතුකර ගැනීම පිණිස මෙන් ම පරිසිකම සහ පොළොං වංශික බව පෝෂණය කිරීම පිණිසත් ආගම උපයෝගි කර ගන්න පුළුවන්. ආත්මාවබෝධය පිණිස මෙන්ම ආත්ම වංචනය පිණිසත් ආගම යොදාගන්න පුළුවන්. දහම දැකීම සඳහා මෙන්ම දහම සැඟවීම සඳහාත් ආගම යොදාගන්න පුළුවන්.

තමන් ආගම පරිහරණය කරන්නේ, කුමක් වෙනුවෙන් ද යන්න රඳා පවතින්නේ, පුද්ගලයගේ විචාර බුද්ධිය සහ මනුස්සකම අනුවයි. මනුෂ්‍යයකුට ආගමක් තිබිය යුතු බවත් එය කුමන හෝ එක් ආගමක් පමණක් විය යුතු බවත් සියලු ආගමිකයන්ගේ පිළිගැනීම යි. ඒ අනුව, යුවලකට හැකි වුවත්, පුද්ගලයෙකුට බෑ බහු ආගමික වෙන්න.

මගේ පෞද්ගලික අදහස වන්නේ, මනුෂ්‍යයන් කිසියම් ආගමකට ලේබල්ගත නොවී, හැම ආගමකින් ම යහපත් දේ උකහා ගැනීම වඩාත් ගැලවීම්දායක බවයි. එවිට ආගමේ නාමයෙන් එදිරිවාද හෝ ගැටුම් ඇතිවන්නේ නෑ. අන්‍යාගමිකයන්ට එකඟ විය නොහැකි උගැන්වීම් හැම ආගමකම තියෙනවා. ආගම් භේදයකින් තොරව ඕනෑම කෙනකුට පිළිගත හැකි දේත් හැම ආගමකම තියෙනවා. ආත්මයක් නැතැයි යන බෞද්ධ උගැන්වීම බෞද්ධයන්ට හැර වෙනත් අයට පිළිගන්න බෑ. එකඟවිය නොහැකි නොවැටහෙන දේ නොතකා හැර, එකඟවිය හැකි දේ ආගම් භේදයකින් තොරව උකහා ගැනීමට අපට ඇති අවහිරය කුමක් ද?

එහෙත් බුදු දහමෙහි උගැන්වෙන බ්‍රහ්ම විහරණ, පංචශීලය, අෂටාංගික මාර්ගය ආදිය කිසිම ආගමකට පටහැනි නෑ. ඕනෑම් කෙනකුට ප්‍රයෝජනවත්. කාලාම සූත්‍රය ඕනෑම කෙනකුගේ ප්‍රඥාව විවර කරන්නක්. ගිලනුන්ට උවටැන් කිරීම බුද්ධ පූජාවයැයි යන බුද්ධ වචනය කෙතරම් ශ්‍රේෂ්ඨද? කිතු දහමෙහි උගැන්වෙන කන්ද උඩ දේශනාව, රන් අණ, ප්‍රේම පාරමිතාව (1 කොරින්ති 13) ඕනෑම කෙනකුට කෙතරම් වටිනා උගැන්වීම් ද?

සැම මනුෂ්‍යයෙක් ම එකම දෙවියන්ගේ දරුවන් බව, සැම කෙනකු තුළම තනිවී දුක් විඳිමින් සිටි දෙවියන්ව හැඳිනුවේදැයි අවසාන විනිශ්චයෙහි දී විමසන වග, දෙතුන් දෙනකු හෝ එකමුතු වන තැන දෙවියන් ජීවමාන වන බව ආදිය කෙතරම් අර්ථවත් උගැන්වීම් ද? වචන මට්ටම ඉක්මවා මනුෂ්‍යයන් ඒවා වටහා ගන්නේ නම් කෙතරම් යහපත් ද?

එකම ආගම ප්‍රේමය වූ
එකම ජාතිය මානව වූ
ඒ නව ලෝකය පැමිණේවා !

**සපුගස්කන්දේ රංජිත්**

# ප්‍රේමයේ බලය හා ධනයේ බලය

බලයේ මූලාශ්‍ර දෙකකි.
එක මූලාශ්‍රයක් දූෂිතය. විනාශකාරිය. ඒ මූලාශ්‍රය වනාහි ධනයයි. වර්තමාන දේශපාලන බලයේ මූලාශ්‍රය වන්නේ ධනයයි.
ඒ නිසාම එකී බලය දූෂිත වේ. ධනය මත උපදින බලය දූෂිතය.
වැඩිපුර ධනය මත උපදින බලය වඩාත් දූෂිතය.
ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම අද ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රමය එකී දූෂිත බලය මත පදනම් වූවකි.
මැතිවරණ යනු එකී දූෂිත බලය සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ මුද්‍රාව ලබන ව්‍යාජයකි.

පාර්ලිමේන්තු බලය මුළුමනින්ම ධනයේ බලයේ පිළිබිඹුවකි. එය ජනතාවගේ බලය නියෝජනය නොකරයි. ඒ බව අවබෝධ කරගත යුතුය.
බලය උපදින දෙවන මූලාශ්‍රය ප්‍රේමයයි.
එය විමුක්තිදායකයි. ගොඩනඟයි. නිදහස් කරයි, සේවයට කැපවෙයි.
බුදුන්වහන්සේට තිබුණේ, ජේසුස් වහන්සේට තිබුණේ, මොහොමඩ් නබි තුමාට තිබුණේ එකී ප්‍රේමයේ, මෛත්‍රීයේ බලයයි.
සැබෑ බලය යනු ප්‍රේමයේ බලයයි.
අංගුලිමාල මහරහතන්වහන්සේ බවට පරිවර්තනය කළේ මෛත්‍රියේ ප්‍රේමයේ බලයයි.
සංඝ සමාජ එනම් සාංඝික වූ භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා සංඝය බිහිවූයේ එකී මෛත්‍රිය බලය තුළිනි. පව්කාර ස්ත්‍රිය සාන්තුවරියක බවට පත්වූයේ ප්‍රේමයේ බලයෙනි. දේපළ පොදුවේ තබාගත් මුල් ක්‍රිස්තු සාංඝික, ශ්‍රාවක සංඝය බිහි වූයේ ප්‍රේමයේ බලය තුළිනි.

පවුල් බලයක් නොතිබූ, වතුපිටි ගේදොර හා ධන බලයක් නොතිබූ, සම්මත උපාධි දස්කම් සහිත උගත්කම් බලයක් නොතිබූ, දේශපාලන බලයක් නොතිබූ, නාසරතයේ දුප්පත් වඩු කාර්මිකයකුගේ හා ගැමි යුවතියකගේ ගැමි කම්කරු පවුලක පුතකු වූ ජේසුස් සතු බලය කුමක්දැයි එදා පූජක පාලක ප්‍රභූ පන්තියට සේම ජනතාවටද ප්‍රශ්නයක් විය.

'ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරි බලයකින්ද ? ඔබට මේ බලය පැවරුවේ කවරෙක්ද?' (මැතිව්21/3).

ජේසුස්ගේ බලය පිළිබඳ එකී ප්‍රශ්නය උන්වහන්සේගේ මරණය කෙරෙහිද තදින් බලපෑවේය. ඒ බලය හුදෙක් දේව පුත්‍රයා වීම නිසා ලැබුණ එකකැයි කීම බලයේ සැබෑ මූලාශ්‍රය වන ප්‍රේමය ද්විතීය කිරීමකි. දෙවියන් යනු ද ප්‍රේමය බවයි ජුවාම් සඳෙස පවසන්නේ. දේව බලය යනු ප්‍රේමයේ බලයමය. ප්‍රේමයේ බලය යනු දේව බලයම ය.

දේව බලය ප්‍රත්‍යක්ෂ ලෙස ප්‍රකාශ වන්නේ දේව ජනතාව තුළය. දේව ජනතාව යනු හුදෙක් ක්‍රිස්තියානි ජනතාව නොවේ. විමුක්තියට සාපිපාසිත පීඩිත ජනතාවය. ක්‍රිස්තියානි යනු ම එකී පීඩිත ජනතාව තුළ දේව බලය ප්‍රකාශ වීමේ අත්දැකීමක් තුළින් උපන් දහමකි. ඒ අත්දැකීම නික්මයාමයි.

ධනයටත්, දෙවියන්ටත් ඔබට එක විට සේවය කළ නොහැකිය. ඔබ එකකට ප්‍රේම කරන විට අනකාට වෛර කරයි. යනුවෙන් ජේසුස් පැවැසූ මහා සත්‍යය අප අවබෝධකරගත යුතුය.

ප්‍රේමයේ බලය අදහන්නන් මිස පල්ලි යන්නන් කිතුනුවන් නොවේ. ප්‍රේමයට ඉඩ දෙන්න. ප්‍රේමයට බාධා කරන දේවල් ඉවත් කරන්න. ප්‍රේමයට බාධා කරන සමාජ ක්‍රමය වෙනස් කරන්න, ප්‍රේමයාණන් තුළ නැවත ඉපදෙන්න.

මහින්ද නාමල්

# බලය ජනගතකරණය ..........

<u>බලයේ හරය</u>

බලය සංක්ෂිප්තව නිර්වචනය කළ හැක්කේ තීරණ ගැනීමේ අයිතිය ලෙස ය. තීරණය ගැනීම සැමවිටම ඒකාග්‍ර පදනමක් මත පිහිටා යුක්ති ගරුකව කළ යුත්තකි. යම්කිසි සමාජ, සංස්කෘතික, දේශපාලනික, ආර්ථික සන්දර්භයක පවතින ගැටලුවක් නම්, ඒ පිළිබඳව තීරණ ගැනීමේදී මේ සියලු අංශ සාකල්‍යවාදීව සැලකිල්ලට ගනිමින් තීරණය ගත යුතු අතර ඒ තීරණයට ඍජු සහ වක්‍රව බලපාන සැම පාර්ශ්වයක්ම දැනුවත් බව තහවුරු කරගත යුතුය. කෙසේ වුවත් මේ තීරණ සාධාරණ, යුක්ති සහගත, සාමශීලී වන්නට නම් තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආධ්‍යාත්මික හර පදනමක් මත පිහිටිය යුතුය. මේ ආධ්‍යාත්මික හර පදනමෙන් බැහැරව තීරණය ගන්නේ නම්, එය සැබැවින්ම බලය අපයෝජනයකි. මෙවැනි බල අපයෝජන සමාජ පරිහානියේ සොරොවු විවෘත කරමින් මනුෂ්‍යත්වය සෝදාපාළුවට ගොදුරු කරයි. අද අප දේශයක් ලෙස අත් විඳින්නේ මේ සෝදාපාළුව නොවේද?

<u>බලය පුද්ගලීකරණය</u>

දේශයක සම්පත් අයිති ඒ දේශයේ පුරවැසි ජනතාවටය. ඒ නිසා සම්පත් පරිහරණය හා ආයෝජනය පිළිබඳ තීරණ ගැනීමේ බලය හිමිවන්නේ ඒ ජනතාවටය. එහෙත් මේ ජනතා සතු බලය, ඔවුන් විසින්ම නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රය හරහා ආණ්ඩුවකට පවරනු ලබනවා. එහෙත් මෙම පවරා දෙනු ලබන බලය වගකීමකින් හා වගවීමකින් තොරව ආණ්ඩුව හසුරුවන්නේ ජන අභිලාෂවලට පටහැනිවය. මෙහිදී සිදුවන්නේ ජනතා සතු බලය ආණ්ඩුවේ ප්‍රධානයන්ගේ පෞද්ගලික බලය බවට හරවා ගැනීමය. එනම්, "බලය පුද්ගලීකරණයයි". මෙලෙස ජනතාවගෙන් බලය පරා රෝපණය කරන්නේ හුදකලාව නොව, ගෝලීය බලය පුද්ගලීකරණය කරගත් ගෝලීය චෞර වළල්ලක් වැනි සංසදයක් හා ජාලගතවීමෙන්ය.

කුමක්ද මේ චෞර සංසදය? රුසියාවේ සෝවියට් සමූහ ආණ්ඩුව විසුරුවා හැරීමෙන් අනතුරුව, 2019 දී මේ සංසදය ගොඩනැගෙන්නට වූ අතර, එහි සාමාජිකයෝ සමහර විට එදිරිවාදීන්වූ අතර සමහර විට හතුරෝ වූහ. නමුත් ඔවුන් සැම ඒකාබද්ධ වූයේ, ඔවුන්ගේ පොදු අරමුණ වන "බලය පුද්ගලීකරණයටයි." මේ සංසදය ලෝකයේ බල කුලුනු තුනක් පාලනය ඇරඹුවේය. ට්‍රම්ප්ගේ වොෂිංටන් ධවල මන්දිරය, පුටින්ගේ ක්‍රෙම්ලිනය, ජින්පිංග්ගේ බෙයිජිං මේ බල කුලුනු තුනයි. මේ බල කුලුනු තම බලය යොදවමින්, ගෝලීය සම්පත් මුදල් විශුද්ධිකරණයේ චෞර ක්‍රියාවලියට තුන්වන ලෝකයේ අපේ රට වැනි රටවල සම්පත් සොරා කෑම සඳහා දේශීය ආණ්ඩුවල නායකයන් යොදවා ගනිති. මේ චෞරතන්ත්‍රයේ න්‍යාය වන්නේ, 'බලය මුදලට හැරවීමත්, අවශ්‍ය වූ විට ඒ මුදල බලයට හැරවීමත්ය.'

ජනතා බලය මෙලෙස පුද්ගලීකරණයට ගොදුරුවන්නට ඉඩ හරිනතාක් මේ ගෝලීය හා දේශීය චෞරතන්ත්‍රයේ යටත් වැසියන් ලෙස ජීවත් වීමට සිදුවේ. එසේ නම්,

<u>ප්‍රජාතන්ත්‍රය මුදවා ගත හැකිද?</u>

ඉතාලියේ ෆ්ලොරන්ස්හි පිහිටි යුරෝපීය විශ්ව විද්‍යාල ආයතනයේ මහාචාර්ය ඩොනාටෙල්ලා පේරටා, "Can Democracy Be Saved" කෘතියෙන් පෙන්වා දෙන්නේ, මේ ප්‍රශ්නයට, ප්‍රජාතන්ත්‍රය මුදවාගත හැකිද යන්නට පිළිතුර ශුභවාදී විය හැකි බවය. එහෙත් මේ ශුභවාදී ප්‍රවේශයකට එළඹෙන්නට නම් ප්‍රජාතන්ත්‍රය පිළිබඳ සංකල්පය සහ භාවිතය මෙන්ම ඒවා දෙස බලන ආකාරයද වෙනස් කරගත යුතුය කියාය. වැඩි වැඩියෙන් විරෝධතා දක්වන සක්‍රිය පුරවැසියන් හා දේශීය දැනුම මෙන්ම විශේෂ ගෝලීය දැනුමක් අවශ්‍ය සංකීර්ණ ගෝලීය ප්‍රශ්න

ඉදිරියේ නියෝජනය සහ බහුතර ඡන්දය පමණක් තවදුරටත් වලංගු නොවන බවත්ය. ප්‍රජාතන්ත්‍රය වෙළඳ පොළක්ය යන ප්‍රතිරූපය විනාශකාරී ලෙස පොළඹවන්නේ, සාමූහිකත්වය අවශ්‍ය කාලයේදී මමත්වය, ආත්මාර්ථය ඉස්මතු කිරීමය. මෙලෙස ප්‍රජාතන්ත්‍රයට තර්ජනයකට මුහුණ දීමට සිදුවී ඇත්තේ ප්‍රජාතන්ත්‍රය සඳහා වූ සංකල්ප සහ භාවිත නොසලකා හැරීමය. මෙහිදී අපි කළ යුත්තේ සහභාගීත්වයට සහ සාකච්ඡා කර සම්මුතියකට එළඹීමට ප්‍රමුඛතාව දීමය. මේ සඳහා කළ යුත්තේ කුමක්ද?

## ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය

ජාත්‍යන්තරව පිළිගත් දේශපාලන විද්‍යාඥයකු වන රොබට් ඩහාල් සූරීන් ප්‍රජාතන්ත්‍රය නිර්වචනය කර ඇත්තේ "ආණ්ඩුව පුරවැසියන් දේශපාලනික සමාන වූවන් ලෙස සලකා ඔවුන්ගේ අභිලාෂ කෙරෙහි අඛණ්ඩව දක්වන ප්‍රතිචාරාත්මක බව ප්‍රජාතන්ත්‍ර ආණ්ඩුකරණය" ලෙසය. තම දේශයේ පුරවැසියන්ගේ අභිලාෂවලට ප්‍රතිචාරය දැක්වීමට හැකි ආණ්ඩුවක්, සෑම පුරවැසියකුටම සහතික කළ යුත්තේ තමන්ට,

- තමන්ගේ මනාප පෙළගැස්විය හැකි බවට
- එලෙස පෙළගස්වා ගත් මනාප තම සහෝදර පුරවැසියන්ට ආණ්ඩුවට සාමූහික සහ පුද්ගල ක්‍රියාකාරීත්ව ලෙස ඉදිරිපත් කිරීමට හැකි බවට
- ආණ්ඩුවේ ක්‍රියා කලාපයේ දී පුරවැසියන්ගේ මනාප සමබරව කිරා බැලිය යුතු අතර මේ මනාපවල මූලාශ්‍ර කෙරෙහි හෝ අන්තර්ගතය කෙරෙහි කිසිදු වෙනස්කමක් නොදක්වන බවය.

## බලය ජනගත කිරීම

- සක්‍රිය පුරවැසියන් ලෙස අපි අපේ අභිලාෂ පෙළගස්වා ජනාධිපතිවරණ ප්‍රකාශන ප්‍රතිපත්ති සමග සසඳමින් ඇගයුමකට යොමුවෙමු.
- ජනාධිපති අපේක්ෂකයන් ඉදිරිපත් කරන සෑම පක්ෂයකම කොතරම් දුරට ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය සඳහා වූ ව්‍යුහයන් සහ ක්‍රමවේදයන් සහතික කර ඇත් දැයි විමසා බලමු.
- ප්‍රජාතන්ත්‍රය, චෞරතන්ත්‍රයට පොළඹවන වෙළඳපොලේ මෙවලමක් බවට යොමු කරවන දේශපාලන පක්ෂ තෝරා බේරා ගනිමු. ඒවා ප්‍රතිපක්ෂ කරමු.
- පවතින දේශපාලන යථාර්ථය තුළ කිතුනු අපේ දේශපාලනික මෙහෙවර ප්‍රවර්ධනය කරන්නට නම්,

» අපි දේශපාලන යථාර්ථය තුළ, ජේසු තුමා අපව කැඳවන්නේ එතුමා මෙන්, " පොළොවේ" ලුණු වන්නටය. "ලෝකයේ ආලෝකය" වන්නටය. (මතෙව් 5 : 13 - 14) අප තුළ ලුණු රසයේ පවත්වාගෙන යෑමට, අඳුරු දේශපාලනයට පහන් රැකක් වන්නට අපේ දේශපාලන සන්දර්භය, බයිබලීය දේවවචනය මත පිහිටා ආවර්ජනය කරමු. ඒ ආවර්ජනයෙන් දේශපාලනික ක්‍රියාකාරිත්වයට පිවිසෙමු. සැමදා යැදුමෙන්, " ඔබවහන්සේගේ රාජ්‍ය අපේ දේශයට පැමිණේවා" දෙවිඳුන් යදිමින් අපේ කිතුනු දේශපාලනයේ, ලුණු රසය පවත්වා ගනිමු.

» ජේසුස් වහන්සේ දේවමාලිගාව පවිත්‍ර කරමින් කියා සිටියේ "මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤාවේ ගෘහයකැයි කියනු ලබන බව ලියා නැද්ද? එහෙත් ඔබ එය හොරුන්ගේ ගුහාවක් කරගෙන ඇතැයි" කියා ය. අප ජීවත්වන මේ සම්පත් බහුල මේ සුන්දර දිවයින ද "හොර ගුහාවක්" කරන ගෝලීය සහ දේශීය, "බලය පුද්ගලිකරණයේ" දේශපාලනයෙන් මුදවා ලන බලය ජනගත කරන දේශපාලනයට අවබෝධාත්මකව කැපවෙමු.

**වී. ලෙ. පීරිස්**

# සියලු බලයන්ට ඉහළින් වැජඹෙන දේව ආදරයේ බලය ...

සත්‍ය වශයෙන්ම බලය යනු කුමක්ද? "බලයක් යනු, නිශ්චලව පවතින යමක් චලිත කර වීමට හෝ, චලිත වන යමක් ඒ දිශාව වෙනස් කිරීමට හෝ, යම් වස්තුවක හැඩය වෙනස් කිරීමට භාවිත වන දෙයක් ලෙස අර්ථකථන සපයයි. විද්‍යාත්මක පසුබිම පසකින් තබා පොදු ව්‍යවහාරය දෙස හැරී බැලූ කල මේ වචනය සමාජය තුළ බිය මෙන්ම සතුටද ජනිත කළ හැකිය. දේශපාලන පසුබිම ඔස්සේ විග්‍රහ කර බැලූ කල මේ සඳහා ජනතාව තුළ බිය උපදින බව නම් නොරහසකි. මේ සඳහා අප රට තුළ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා උදාහරණ තිබේ. ආදරයේ බලය පෙන්වූ, සර්ව බලධාරී පියාණන් වහන්සේ සතු බලයට සම කිරීමට මෙලොව කිසි ජගතකු මෙතුවකට සමත්ව නැත. මතුවටත් එය එසේමය.

මේ පිළිබඳව අප මාතෘකා කිහිපයක් ඔස්සේ විමසුමට ලක් කරමු.

1. මැවීම තුළ දේව ආදරයේ බලය

ආදම් හට සහකාරියක් මවා දෙමින්ද, ආදම් තුළ වූ තනිකම මකා දමමින්ද දේව ආදරයේ නිරන්තර වැඩ විසීම මනාවට පිළිබිඹු කළසේක. එහෙත්, දේව ආදරය උතුම් බලය අත්දැකීමට සාතන්ට ඉඩ නොතැබූහ. "ස්ත්‍රීයද ගස පෙනුමට කෙතරම් රමණීයද, පල කෙතරම් ප්‍රණීතද, නුවණ වැඩුමට කෙතරම් කදිමද කියා දුටු විට එයින් ගෙඩි කීපයක් කඩා කෑවාය" (උප්පත්ති 3:6). ඇසට ප්‍රණීත වීම තුළ, මුවට දැනුණු රසය තුළ, නිහතමාන බව නොමැති කම තුළ අපගේ ආදි මව්පියන් විසින් පාපය නමැති අම්හිරි අකුරු ත්‍රිත්වයේ එල භුක්ති විඳීම අරඹන ලදි. එය එසේ වන විටත්, දේව ආදරය මෙලෙස දැක්වීමට තරම් දෙව් පියාණන් වහන්සේ කාරුණික වූ සේක. ඒ කාරුණිකත්වය තුළ දෙවියන්වහන්සේ තම ආදරයේ බලය මුළු පුරාණ ගිවිසුම පුරා පෙන්වූහ.

ජනතාව පුරාණ ගිවිසුම තුළ ක්‍රමිකව දේව ආදර බලය වැඩි වුවද, එය මිනිසුන්ට අත්‍යවශ්‍ය දෙයක් සේ නොසලකා, මගහැර, සුන්දර පාප මාර්ගයේ ගමන් කරමින් සිටියහ. විවිධ දිවැසිවරුන් මගින් ස්වර්ගීය පණිවිඩය මිහිතලයට පතිත වුවද, එය ඇසූ දෙයක් පමණක් වන තරමට අසන්තෘප්ත විය. එහි අග්‍ර ප්‍රතිඵලය පුරාණ ගිවිසුමේ නොපෙනෙන දෙවියන් වහන්සේ මිනිස් වෙස් දරමින් මරිමව් කුසින් මෙලොවට, තම දේවත්වය පසක ලා බිහි වීමය. එනම්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙලොව බිහි වීමය. ඒ ආදරයේ බලය පව්කාර දුගී දනන් වෙනුවෙන් මෙලොවට බිහිවන්නට තරම් කීකරු වී පහත් වූ බවට ම නොරහසකි.

2. කුරුස ගමනට පෙර ඇති වූ දේශපාලනික බල අරගලය

ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ තුන් අවුරුදු ජීවිතය තුළ තම පියාණන්ගේ කැමැත්ත මිහි මත ඉටු කළ සේක. උපමා ඇසුරින් ස්වර්ග රාජ්‍යය පිළිබඳ පුවත් පතුරමින්, රෝගීන් හට සුවය දානය කරමින්, මළවුන් නැගිටුවමින් වැනි විවිධාකාර ප්‍රාතිහාර්ය පාමින් දේව සැලැස්මේ ප්‍රබලත්වය පතුරුවන්ට ඇරඹූ සේක. පූජකවරු, පරිසිවරු, සදිසිවරු වැනි ඉහළ සමාජ නිලතල දැරුවන් බලපොරොත්තු වූ මෙසියානිකවරයා ජේසුස් වහන්සේ පැමිණි අයුරින් පැමිණෙතැයි හීනයකින් හෝ නොසිතූ නිසා මේ අවුරුදු තිස් තුනක් වයසැති තරුණයාව ඔවුන් දකින්න පුරුදුව සිටියේ, කැරලිකාරයකු, අරගලකාරයකු ලෙස නිසා තම තත්ත්වය, නිලය, බලය රැක ගන්න, මිනිස් වෙස් ගත් දේව පුත්‍රයාව අමු අමුවේ වියළි ගහක එල්ලන්න සැලසුම් කළහ.

දෙවියන්ගේ කැමැත්ත ඔවුන්ට වාසි වන අයුරින් සිදු වන විට, තමන් සමග එක්ව රාත්‍රී ආහාර වැළඳූ, දෙවියන් වහන්සේගේ භාණ්ඩාගාර ප්‍රධානයා රිදී තිහකට පාවා දීම මෙලොව සිදු වූ නින්දිතම පාවා දීම යැයි පැවසුවහොත් වරදක් නැත. අන්නාස් සහ කයිපාස් යන දෙපළත් මාන බලමින් සිටියේ, මේ තරුණයාව කෙසේ හෝ විනාශ කර දැමීමටයි.

පිලාත්ගේ රාජ බලය පරිදි ඔහුට වරදකරුවකුව නිදහස් කිරීමට හෝ මරණීය දණ්ඩනය දීමට හැකියාව ඇත. කිසිදු වරදක් නොමැති මේ වයස අවුරුදු තිස්තුනේ

තරුණයාට මරණ දඬුවම දෙනවාද ? නැද්ද ? යන්න තවමත් පිලාත් දෙගිඩියාවෙනි. ඔහුගේ පූර්ණ උත්සාහය ජේසුස් වහන්සේව නිදහස් කරන්නට වුවද, නිලයට, වස්තුවට ඇති කෑදරකම, බලයට ඇති ලෝභය නිසා හිතට එකඟ පිළිතුරකට පිලාත්ට තවමත් පැමිණීමට නොහැකිය. රජ වාසලට යළිත් ඇතුළුවී ජේසුස් වහන්සේ අමතා, "ඔබ කොහෙන් එන සේක්දැ යි ඇසීය. ... එබැවින් පිලාත් කථා කොට, ඔබ මට පිළිතුරක් ලබා නොදෙන්නෙහිද? ඔබ නිදහස් කර හරින්නට හෝ කුරුසියේ ඇණ ගසන්නට හෝ මට බලය ඇති බව ඔබ නොදන්නෙහිද?" (ජොහාන් 19:9-10). තමන්ට ලැබුණු අධිකාරි බලය තුළ අනවශ්‍ය ලෙස බලය මුදා හරින්නට යන පිලාත්ට, ඔහුවම නිරුත්තර වන පිළිතුරක් දීමට උන්වහන්සේ මුඛය විවෘත කරන්නට සූදානම් ය. "දෙවිඳුන් විසින් බලය නොදෙන ලද්දේ නම් මට විරුද්ධව ඔබට කිසි බලයක් නැත" (ජොහන් 19:11). දෙවියන්ගෙන් ලද බලය අපයෝජනය කිරීමට ගොස් අවසානයේ නායක පූජකවරුන්, පාලකයන් සහ සියලු දෙනාම එහි උපරිම ආනිසංසය ලබා ගත් බව අප කවුරුනුත් දන්නා සත්‍යතාවකි.

දේශපාලනය හෝ කුමන හෝ ආකාරයක බලයක්, අධිකාරීත්වයක් අප සතු නම්, එය සත්‍ය වශයෙන්ම අප දෙවිඳුන්ගෙන්ම ලද දෙයකි. එය අප භාවිත කළ යුත්තේ ද, ස්වර්ග රාජ්‍යය මෙලොව තුළ බිහි කිරීමටය. ඒ පිළිබඳව සිත්හි තබා ගෙන බලය, ආදරයේ සංකේතයක් බවට පත් කර ගැනීමට උත්සාහ කරමු.

### 3. ක්‍රිස්තුන් වහන්සේගේ සහ වත්මන් ලෝකය තුළ ආදරයේ බලය

යම් පුද්ගලයෙක් ආදරයෙන්ම පරිපූර්ණ නම් ඔහු හෝ ඇය සතුටින් කල් ගෙවයි. උදාහරණයක් ලෙස නවක ආදර යුවලක් ගත හැකිය. එහෙත් වර්තමානයේ උක්ත වචනයේ බලය අඩුවෙමින් පවතී. අද එය, අනවශ්‍ය ලිංගික එක් වීම්, SPA මධ්‍යස්ථාන, දූෂණය හා ලිංගික අතවර ඔස්සේ එහි බලය අඩු වී ඇත. ඒ තරමට ඒ වචනය ප්‍රබලය. එහෙත්, දෙව්ලොවින් මනුලොවට පැමිණි ක්‍රිස්තුස් වහන්සේගේ ආදරය ඊට හාත්පසින්ම වෙනස් ය. එලෙස ආදරය දක්වන්නට ඔබටත් මටත් හැකි නම් ඔබත් මමත් මෙලොව ක්‍රිස්තු වරයෙකි.

පව්කාර ස්ත්‍රීයට ගල් ගහන්න පරිසිවරු, පූජකයෝ පස්සෙන් එලවද්දි, මහා සිත් හැරීමක් දුන් ජේසු,

මල් උයනේදි මල්කුස්ගෙ කපාපු කන
අරන් බද්ධ කරලා සමාව දීපු ජේසු,
කුරුස ගසේදී තමන්ට වද දීපු ජුදයන්ට
සමාව දීපු ජේසු,
අවසාන තත්පරයේදී, අන්ධ ජුදෙව්වාට
පෙනීම දීපු ජේසු.

ඔය තමයි ජේසුගේ ආදරය, ඒ ආදරය සමාව දීමේ ආදරයක් මිස පලිගැනීමේ ආදරයක් නොවෙයි. පුරාණ ගිවිසුමේ යම් නීතිවලට නව අර්ථකථනයක් දුන් උන්වහන්සේ නව ගිවිසුම මුළුමනින්ම ආදරයේ ප්‍රබලත්වය මත ගොඩනැගුන සේක. පේදුරු පැමිණ සමාව දිය යුතු වාර ගණන අහද්දි, සමාවට සීමාවක් නොමැති බව කියා සිටිනුයේ, ආදරයේ ප්‍රබලත්වය මනාවට කියා පාමිනි. නව ගිවිසුමේ ප්‍රධාන බලය ආදරය හා සමාව යන ද්විත්වයයි. වර්තමානයේ ඔබටත් මටත් මෙම කරුණු දෙක සමාජ ගත කිරීමට හැකි නම් ඔබත් මමත් තවත් ක්‍රිස්තුවරු වෙමු. එය කළ යුත්තේ යහපත් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් නොවේ. දේව පුත්‍රයාට හිමි වූයේ, දෑත් දෙපා ඇණ තුනකට හිර කරපු ගහකි. කිතු අනුගාමික ඔබද මමද එලෙස විය යුතු වෙමු. මෙලොවට සීමා වී සිටීම අපට යුතු නැත. එලොව සම්පත් ලැබීමට නම් වර්තමානයේ තවත් ක්‍රිස්තුවරුන් වීමට එක සිතින් අදිටන් කර ගනිමු.

### 4. සියල්ල මෙසේ වීමට බලපෑ මරි මවගේ ඉවසීමේ බලය

"එවිට මරිය තුමී දේව දූතයාට කථා කොට, බලන්න, මම සමිදාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා යි කීවාය". ඇයට කෙතරම් හීන මාලිගා කොතෙකුත් තිබුණත්, ජුදා සමාජ නීතිය ගැන

23 වන පිටුවට ....

බුද්ධික සඳරුවන්
ශා. ඇලෝසියස් දෙව්සත්හල.

## රටට තියෙන ආදරයට

මොළය තියෙන විටදි නැහැයි කියා කියනමුත් බලය
බලය ලබා ගැන්මට නිම නැත කරනා අරගලය
බලය තියෙන විට නැත කිසිවක් බැරි මත මිහිතලය
එය අද දවසේ පවතින බල අරගලයට මුලය

එදා වගේ නෙමෙයි මෙදා බලය ලබාගත් පසුව
සුරංගනා කතා මතක නොමැත මෙයින් පෙර දෙසුව
ගෙදර කෙනාවද මදිවෙයි දුම කාගෙන බත පිසුව
මාලිගයක් නැතුව බැරිය ගේදොර වෙනුවට විසුව

සැමට පෙනෙන යුක්තිය සත්‍යයද නිහඬ කළ හැකිය
යුතුකම් වගකීම් පැහැර හැර ඉන ගැලවෙනු හැකිය
එකක් කියා අනිකක් කර අත් සෝදා ගත හැකිය
ගැහැනිය පිරිමියකු කරනු හැර අන් හැමදේ හැකිය

බලය ලබාගැන්මට ලොකු මුදලකි වියදම් වන්නේ
නැතුව බැරිය බලය ලැබුණු පසුවට එය පියවන්නේ
ජාවාරම් කොමිස් කුට්ටිවලිනි පිය ඔස වන්නේ
මොන එකටද මේවා ගැන එකවකදේ දොඩවන්නේ

කබල් වාහනේකින් දැන් නොහැකියමෙන් පෙර දවසේ
දහදෙනකුට රැස්වන්නට ඉඩ නැත වෙසෙනා නිවසේ
බලය ලැබුණු පසු උත්තමයන් නිරතුරුවම ගැවසේ
ඔවුන් සමග පියඹා නොගිහින් හැකි වේවිද සුවසේ

එතෙර යවන්නට දරුවන් ලැබගන්නට සිප් සතර
වරම ලැබෙයි බලය තුළින් මෙහිවී නොහැකිය නතර
බලය උරුම විය යුතු වෙන අය නැත දරුවන් විතර
ඒ වෙනුවෙන් හොඳහැටි ඇප කැප විය යුතුමය නිතර

බලය ලැබෙන්නට පෙර කළමුත් සැම හා ගැවසීම
ඉන් පසු එය නොහැකි බව කළ යුතුමය පැවසීම
වෙනුවට සුදුසුකම් තියෙන අයට සහන සැලසීම
නොකර බැරිය පන්දම අල්ලන ගැත්තන් පිනවීම

පෙරළෙන පිට දෙසය දෙනෙත් යොමුකරගෙන පසුවන්නේ
එදා බැන්න අයට මෙදා සෙනහසකි පෙන්වන්නේ
බලය සදා රැකගන්නට නැතුව නොහැක හැකිවන්නේ
රටට ආදරේට බවයි මේ සැම පිළිගන්වන්නේ

**පස්කල් ජයමාන්න** - උස්වැටකෙයියාව


## ඇලොයි පිය උපහාර !



පියතුමකු නම් උදා තරුවමය මඟ පෙන්වන
අකීකරු පුතුන් එනතුරු මඟ බලා හිඳින
අවු වැසි අකුණු සැර දරමින්
මිහි කත මෙන් නිහඬව
බෙදා දෙන දම් ගඟුල් සිහිලස
දැන හැඳින බොදු කිතුනු දසුන්
සකු පාලි ග්‍රීක හීබෘ මූලයන් ගේ සිටම
හැදියාවද රකිමින් මෙලක
තුලනය කරමින් ගැටුම්
දෙසුවද දහම් මඟ
ඇසුවේද කවුරුන් ඒ දහම්
කිතු වදන් මොට කොට - දෙසන වැදි බණ අතුල්ලා
මටසිලිටි කළ සිත්වලට - රළු වැඩිද ඒ දෙසුම්
නෙක පොරොන්දුවලින් විස්මෘතව
අන්ධවූ දේශයක බිහිරි දෙසවනට
තවත් බොරු පොරොන්දුම මිස
නොපෑහුණි ද විමුක්තියක දහම
යදින්නට නුහුරු
කෑ ගසා මොර දෙන්නට බලා හිඳිනා සිතින්
යදිම් එක් වතාවක් අනේ දෙවිඳුනි
නොමගන්න ඔබේ තුරුල ට ඇලෝයි පියතුමන්
අතැඟිලි ගණනටවත් බිහිවනතුරු එවැන්නන්
සියවසක් නීරෝග ආයුෂ වුවද
නිසි තිළිණයක් නොවේමය සැබෑ
ප්‍රේමයේ පණිවිඩකරුවකුට

ගාමිණී අමරසේකර, ගරු විනිශ්චයකාර තුමා

## හැම තැනම අපි හෙව්ව ...



පණ පොවන්නේ නැතිව
ජීවිතේ අත හැරෙන
පන්දාහෙ කොළත් දැන්
වේලකට මාරුවෙන

ජීවිතය විකුණාගෙන
මරණයම උරුම කළ
සිරිලකට හෙටක් නෑ
උන් විසින් හප කෙරුව

ත්‍රිපිටකය බයිබලය
කුරානයේ මම දැක්ක
පන්සලේ පල්ලියේ
හැම තැනම මම හෙව්ව

සැනසුමක් ගෙන දීලා
ජීවිතය වාස්සන
ලෝගු දැන් ගොඩාක් නෑ
ජීවිත පාස්සන ...

චමත් බි පයාගල
කටුකුරුන්ද කළුතර

## බලය

නොලැබුණි නම් දෙවිඳු වෙතින් කොහෙන්ද මේ බලය
සමිඳු ජේසු විමසන්නේ පිලාත් ලද බලය
ලෝ මැවුමේ සිට ඇත්තේ සුදත් සුරිඳු බලය
කිතුනු අපට යහ දිවියට මග පෙන්වන බලය

සුද්ධ සහා උත්පත්තිය ඇරඹෙන දෙව් බලය
ශාලාවෙදි සේනාකුලු අත්දුටු ඒ බලය
මරිය මවුන් සහ සගයන් දිරිගැන්වූ බලය
යුගාන්තය දක්වා අප සමග වෙසෙන ශුද්ධාත්ම බලය

සැත්තෑ සය වසරක සිට රට වනසන බලය
කතිරෙ තමයි පිලාත්ලාට අප දෙන ඒ බලය
බොරු පොරොන්දු පුරවාලා ගන්නව උන් බලය
දුප්පත් අපෙ ජීවිත සැම වනසන බලය

දේව තාත්තගෙ බලයයි දෙලොව උතුම් බලය
ලස්සණ ලෝකයක් මවා දුන්නා රකිනට බලය
දෙව් අරමුණ නැතිවුණදා රජයන්නේ මැර බලය
දැයට හිතැති නායකයන් දුනමැන දෙව් පිය බලය

අයිරින් කොස්තා - කඳවල

## අමිතගේ හද ගැස්ම......



# POWER



The history of the world tells us that the lives of many people and the development of their countries have been ruined by individuals and groups who were hungry and thirsty for power and wealth. Such individuals and groups have also fought to possess power, thereby control the right of individuals and groups to enjoy fuller life. Millions of innocent people have been killed by power-hungry individuals through evil means. The names of the Roman Emperors, dictators like Joseph Stalin and Adolf Hitler have gone down in world history as men of power and of evil spirits. People had been and continue to be made objects to be controlled. History also tells us that power continue to be used specially by men to abuse innocent children and adults.

Sri Lankan history is replete with stories of dominating spirit of the individuals who come forward to rule the country by appealing to racial, caste and religious differences and thereby amass much wealth and remain in the seats of power till they die and ruin the economy. They forget old age chilled and sluggish, worn out with age has passed its time for doughty deeds. Majority of our Sri Lankans are also responsible for the pitiful situation of Sri Lanka because trusting in the fringe benefits promised by individuals and groups on the eve of the general elections, they vote for the incompetent individuals at the parliamentary elections.

Authority is rooted in one's ability to promote the well-being of the people and the development of the country. Men and women of authority are guided not only by education, good family background and profession but also by their virtuous lives- for example respect for innate dignity of every human person which is universal, inalienable and inviolable and the common good of people.

Sri Lanka needs men and women of authority, rooted in virtues (honesty, integrity, accountability, transparency and compassion), good education and professional competence to promote a better physical quality of life of all the citizens of Sri Lanka, transcending race, caste, religion, social background, profession etc. There is a section of our rural and urban masses who, with their feudal mentality, vote for 'incompetent" individuals to occupy seats in the Parliament and cause procrastination of the progress of our people and of our country. Edmund Burke has said, "All that is necessary for evil to succeed is for good people to do nothing."

The spirit of humble service is the theme that was very much articulated by Jesus. Once when Jesus was on his way to Jerusalem to be handed over to suffer and to die, two Apostles, namely the two brothers, James and John, approached Jesus and requested places of honour (Mk 10:35-40; Mt 20-23). On that occasion, Jesus compared the matter of power exercised among the

Gentiles on the people with his notion of service, becoming even a slave (Mk 10:42-45; Mt 20:25-28) and a servant of everyone. Jesus lived his mission and defined it in terms of a servant and a slave (Is 42:1; Phil2:7). Jesus came not to manifest worldly power and exact service from others but to serve people. He acted justly, respecting and loving people tenderly and promoted the inner worth of individuals and the flourishing of life of people. He did not have recourse to violence. National leaders like Mahatma Gandhi of India and Nelson Mandela of South Africa were leaders who were inspired by the life and teachings of Jesus Christ.

**Fr. Emmanuel Fernando OMI**
"Rajabima", Anuradhapura

# උද්දච්ච මෝඩයෝ නොවෙත්වා !

අපට හිමි වන
කීර්තිය, ධනය, බලය ආදී
කිසිම සම්පතකට
අපව
උද්දච්ච මෝඩයන් කිරීමට
බැරි වේවා !

කායික අගය, දැනුම සහ කුසලතා ආදි
කිසිම සම්පතකට
අපේ ප්‍රඥාව නැසීමට
නොහැකි වේවා !

කෙලෙස් මගින් නොනැමෙන
මිනිස් රූකඩ නොවී
සහනයෙන් වෙසෙන
මනසින් උසස් සත්ත්වයන් ම වීමට
වාසනාව
අපට උදාවේවා !

**සපුගස්කන්දේ රංජිත්**

19 වන පිටුවෙන්.....

හෝ නොසලකා දේව කැමැත්තට හිස නමන්නේ, ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි යැයි ප්‍රකාශ කරමින් ය (ලූක් 1:38). ඇයගේ ඉදිරි විවාහ දිවිය පවා හෝ නොසලකා මනා ඉවසීමකින් සහ හික්මීමකින් දේව ආදරයට ඉඩ දුන් අයුරු පුදුමාකාරය. ඇයගේ ඒ ඉවසීමේ බලය අද ඔබෙත් මගෙත් ගැලවීමේ දොරටු විවෘත කළා නොවේද ? අපත් ඉවසීමේ කැඩපත වූ ඇයගේ මග ගමන් කළහොත් ස්වර්ගීය දොරටුවල අගුලු ඇය හරින බවට නම් සහතිකය.

මෝසෙස්ගේ නීතිය අනුව ජේසුස් වහන්සේවද දේව මාලිගාවේ කැප කිරීමට පැමිණි මරිය - ජුසේ යුවලට කෙදිනකවත් නොපැතූ දෙයක් ඇසීමට සිදුවේ. එනම්, "මේ දරුවා ඊශ්‍රායෙල් හි බොහෝ දෙනකුගේ වැටීම හා නැගිටීම පිණිසත්, ප්‍රතික්ෂේපයට ලක් වන දේව සලකුණක් වන පිණිසත් නියමව සිටී. එසේය, ඔබේම හදවත කඩුවකින් අනින්නාක් මෙන් සිදුරු වනු ඇත. මෙසේ වන්නේ, බොහෝ දෙනකුගේ සිත්හි රහස් කල්පනා එළිදරවු වන පිණිසය" (ලූක් 2:34-35). සිමියොන් දිවස්ප්‍රසාදි වරයා තම පුතණුවන් ගැන කී මෙවදන් ඇසූ මරිය වහන්සේ කලබල වූවාට සැක නැත. නමුත්, ඇය මේ සියල්ලම සිත් තුළ නිදන් කර ගනිමින් දේව සැලැස්ම ඇය තුළ ඉටු වන්නට ඉඩ පහදන්නේ, මහත් ඉවසීමකිනි. ඒ මහ පුදුමාකාර ඉවසීම තුළ ඇය ලොව් සතට ගැලවුම දෙන ද්වාරය විවෘත කර හරිනුයේ, මහා ආදරයකිනි. ඉවසන්න, ඉවසන්න, දේව සැලැස්ම ඇය තුළ තව තවත් දරුණු වන්නට විය.

ලැබී ගිලිහෙන බලයකට නොව - ආදර මරි මව් අත දෙන්නේ
සදා ලැබ දෙන් දෙවිඳු ආදරේ - මහා බලයට ඇය ඔසවා ගන්නේ ....



## සුභද ආරාධනා ....... වසර 125 ජුබිලි සැමරුම .......

දයාබර භක්ති ප්‍රබෝධන ලේඛක, ලේඛිකාවනි, බෙදා හැරීමට දායකවන සැදැහැවතුනි, මේ සඟරාව ගැන උනන්දුවක් දක්වන දයාබර පාඨකයනි,

වසර 125 ක ගමන් මඟ සටහන් කරන දෙවියන් වහන්සේට තුති පුදන භක්ති ප්‍රබෝධනයේ 125 වැනි ජුබිලි සාංවත්සරික දෙවිඳුන්ට තුති පිදීමේ දිව්‍ය පූජාව 2024 සැප්, 17 අඟහරුවාදා (පෝය දින) උදෑසන 9.15 ට මරදාන, පාතිමා දෙව්මැදුරේ පැවැත්වේ. එමෙන්ම 2024 සැප්. 29, ඉරුදින සවස 3.00 ට භක්ති ප්‍රබෝධන ජුබිලි වැඩසටහන සහ ජුබිලි තරඟාවලියට සහභාගි වූ ජයග්‍රහකයන්ට ත්‍යාග පිරිනැමීමේ උත්සවය, කොළඹ 07, සා. බ්‍රිජට් කන්‍යාරාම ශ්‍රවණාගාරයේදී ජයශ්‍රීයෙන් පැවැත්වීමට නියමිතය. ඔබත් මේ දින දෙක (2) ට සහභාගි වීමට කැමතිනම්, නම, ලිපිනය, දුරකථන අංකය සඳහන් කර 2024 ජූලි මස 31 දා ට පෙර අපට ලියන්න. එය ආරාධනා පත්‍රය එවන්නට උපකාරයක්වේ.

ලිපිනය : සංස්කාරක පියතුමා, භක්ති ප්‍රබෝධනය, නො. 265, ඩීන්ස් පාර, කොළඹ 10.

## මුතු ඇටය ඔබලන බලයක්

ඕනෑම දෙයක් කරනට කෙරුමට කොයි කාටත් අවැසි වෙනවා බලය
තම තමුනගේ වැඩපල කරගැන්මටත් අවැසියි සිරුරේ සවි බලය
ගෙදර දොරේ වැඩ කර ගන්ටත් බොහෝ ඕනැවේ ශරීර සවි බලය
මේ සැම බලයනට වඩා බලගතුයි සමහරුන්ගේ වචනේ බලය

අරවා මේවා දෙන්නම් කියලා සමහරු බලයක් ගන්නට දොඩවන්නේ
තවත් සමහරු තවත් වැඩ කිඩ පෙන්නලා අමුතුම තාලේ බලයක් පෙන්වන්නේ
අනුනගේ බලයන් පෙන්වන්න ගිහින් බල කොහොමද බලුවී යන්නේ
සමහර ලොක්කන්ගේ බොහෝ බල තිබුනත් බිරිඳව දුටුවම වෙව්ලන්නේ

බලය තිබෙනා බොහොම දෙනා හරි බියෙනුයි ජීවත් වෙන්නේ
මේ බලය රැක ගන්නට දෙන්නට තුන් හතර දෙනා වටේට ඉන්නේ
මොකට ද මේ බලයන් පාරේ බැහැලා යන්නට බැරි නම් වැළඳගන්නේ
දුර සිතුවෝතින් මේ සැම බල යටයි මරුවා බලයෙන් බලවත් වෙන්නේ

අප රට තුළ එදා තිබුණ මහා අරගලයෙන් බොහෝ අයගේ බල බිඳුණා
සමහරුන්ට රට තුළ ඉන්නට බැරි තරමට අපෙ රටෙ අරගලයෙන් සිදුම වුණා
කියපු කරපු හොර බොරු වංචා දූෂණ භීෂණ කොයි කාගෙත් එළිම වුණා
බලය හරියට කරනට බෑ නම් කවුරුත් බලය දෙන්නත් ගන්නත් එපා

ලැබෙන බලය හරියට කරනට බෑ නම් කොයි කාටත් වැඩ වරදිනවා
තම තමුන්ගේ වාසියට එය යෙදුවොත් දන්නෑ කනපිට පෙරලෙනවා
එසේ උණොත් මා පමණක් නොව මගෙ ලස්සණ රට බංකොලොත් වෙනවා
නරින්ට රුවටෙන්න එපා මුතු ඇටෙ බබලන බලයක් ළඟදිම එනවා

**පී. ඩබ්ලිව්. සුනිල් ප්‍රනාන්දු** - වාද්දුව

# ඕං එහෙනං



## බලයේ උමතුව....

සූරිය මාමා

අහස පොළොව ඉර හඳ තරු මහ සයුරද මැව්ව දෙවියනේ
අපා දෙපා සිව්පාවුන් ගංගා ඇළ-දොළ ගස්වැල් මැව්ව දෙවියනේ
රැයද දවාලද වෙන්කර රමණීය ලෝකය තුළ මිනිසා මැව්ව දෙවියනේ
අඩුවක් නැත හිඩසක් නැත එවන් බලය දේව බලය යැයි කිය වෙන්නේ

පෙර පසු උඩ රැකවල් දා සැප වාහන තුළ රිංගා යන අධම මිනිසුනේ
ගස් කපලා පස් ඇදලා කොමිස් කකා රට වනසන නරුම මිනිසුනේ
රටම කකා ජනයා නසා සුදු පිරුවට ඇඟලාගත් දුෂ්ට මිනිසුනේ
වැඩි ඈතක් නෑ නුඹලව ජන බලයෙන් එළවන බව සිතනු මිනිසුනේ

වැස්ස තදවෙයි ජලය ගලායයි කාලයාගේ ගුණ උඩුයටිකුරු බව සිතපන්නේ
උදේ දවල් රෑ කිසි වෙනසක් නෑ දහඩිය ගංගාවක් සිරුරේ ගලා හැලෙන්නේ
ඈන් පෙත්ත කැරකෙන්නේ රස්නෙ ටිකක් අඩුවන්නේ බිලේ තරම හිසේ වදින්නේ
සොබා දහමේ බල බලපන් ඒ බලයට ලොව යට වෙන්නේ

රට හදනා තැන බලකාමින් බැරිබැරි ගානේ දඟලන්නේ
බලයට රසයට කෑදර කරනා තව තව ඉන්නට පොරකන්නේ
හත්මුතු පරපුර දේශය කැබලි කොට විකුණා දියවන්නාවේ පීනන්නේ
බලයේ ඉන්ටයි බලය ගන්නටයි රට විකුණාගෙන උන් කන්නේ

කතිර යුද්ධයක් ළඟ ලඟ එනවා මැයි දිනයේ බල පෙන්වන්නේ
එක එක කුණු රෙදි සෝදා ගත්තා මිස කම්කරුවා ගැන නොසිතන්නේ
ඔප්පු බෙදනවා හාල් බෙදනවා සභා උපදේශකයෝ පත්කර ගන්නේ
මඟුලට මළගමකට නාව උන් ජනතා බලයට යටවන්නේ

හැත්තෑ පස් වසරක් මේ රට කළා දැන් බංකොලොත් වී අපි ඉන්නේ
අතේ සතේ නෑ කන්න බොන්න නෑ ජීවන වියදම උඩ යන්නේ
සිහින පොදි බැඳන් දේශයේ පාලුවෝ දත් තිස් දෙක දැන් පෙන්වන්නේ
උන් උඩු යටි කුරු කර අපායේ දමනා ජන බලයයි ළඟ ළඟ එන්නේ

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



## නායකත්වය සේවය සඳහාම ය

අමල් පන්ති නායකයා වුණාම වැඩියෙන්ම සතුටු වුණේ අමල්ගෙ දඟකාර යාළුවො කණ්ඩායම. මොකද එයාලට ඕන වෙලා තිබුණෙ තමන්ගෙ නිදහසට, දඟ වැඩවලට බාධා නොකරන, ඒවට සහාය දෙන නායකයෙක්. ඒකට සුදුසුම පුද්ගලයා අමල් බවයි ඔවුන් හිතුවෙ.

බාලක පාසලක් වූ එහි උන්නේම දඟ මලු. ගුරුවරුන්ටත් හරි අමාරුයි පාලනය කරන්න. වැඩි දෙනෙක් හිතුවෙ වේවැල් කසාය තමයි දඟකමට බෙහෙත කියල.

අමල්ගෙ පන්තිය භාරව ආවෙ අලුත් ටීචර් කෙනෙක්. ඒ ටීචර් ඉගෙනගෙන තියෙන්නෙ නම් නාට්‍ය හා රංග කලාවලු. ඒත් ඉස්කෝලෙ උගන්වන්න වුණේ සිංහල, ආගම. ටීචර් ටික කලකින්ම තේරුම් ගත්තා කවුද පන්තියෙ කඩාකප්පල් වැඩ කරන දඟයො කියල. පන්තියෙම අවධානය බිඳල දාන්න එයාලගෙ එක රොකට්ටිටුවකට, විසිල් එකකට, හිනාවකට පුලුවන්. ටීචර් මුලින්ම කළේ හැමදාම උදේ ඉස්කෝලෙ පටන්ගන්න කලින් එයාල එක්ක සංගීත නාදයකට රංග අභ්‍යාස කරන එක.

මුලදි අමාරු වුණත් ළමයි ඉක්මනින්ම ඒ රංග අභ්‍යාසවලට හුරු වුණා. එයාල වෙනදට වඩා කලින් ඉස්කෝලෙ එන්නත් පටන් ගත්තා. දඟ කල්ලිය මෙච්චල් කරන්න අමාරු වුණත්, ටීච අමල්ව ළඟින්ම තියා ගත්තා. එයාට වගකීම් පැවරුවා. අන්න එහෙම තමයි අමල් අන්තිමේ පන්ති නායකයා වුණේ.

"අඩේ අමල් මරුනෙ බං. දැන් උඹනෙ පන්ති නායකයා අපිට විරුද්ධව කේලම් කියන්න කෙනෙක් නෑ. අපිට ඕන හැටියට නටන්න පුළුවන්. තාප්පෙන් පැනල ඇවිදින්න යන්න, ඕෆ් පීරියඩ්වල පිට්ටනියට පැනල නටන්න, මල්ලිලගෙ කෑම පෙට්ටි හොරෙන් කන්න කිසිම ප්‍රශ්නයක් නෑ. පන්ති නායකයා දැන් අපේ කල්ලියෙ..."

යාළුවො අමල්ගෙ කරට අතදාගෙන එහෙම කිව්වෙ. ඒ කතාවට නම් අමල් තිගැස්සුණා.

"එහෙම කියන්න එපා ෆ්‍රෙන්ඩ්ස්. මම දැන් ඔයාලගෙ නායකයා නෙවෙයි. පන්තියෙම නායකයා. මට ඒ නායකකම සර් දුන්නෙ විශ්වාසයෙන්. අනික පන්ති නායකයා කියන්නෙ හැමෝටම උදවු කරන කෙනෙක්..."

අමල් තමන්ට හැකි අයුරින් පැහැදිලි කරන්න උත්සාහ කළා.

"අයියෝ ඒ ඔයාට නායකකම දුන්නැයින් අපට කිසිම වැඩක් නෑනෙ. අපේ ජොලි වැඩ ඔක්කොම නවත්වන්න වෙනවනේ. මොනවද අමල් ?"

කල්ලියට නම් හිත නායකකමට මුවා වෙලා ඉස්සරහටත් දඟ වැඩ කරන්නම තමයි.

"කාටවත් හානියක් නොකර අපිට සතුට හොයාගන්න පුළුවන් කොයිතරම් ක්‍රම තියෙනවද? අපේ සර් අපිට උදවු කරයි. මගේ නායකකම අපි හොඳ විදියට "පාවිච්චි කරමුකෝ පන්තියේ හැමෝගෙම සතුට වෙනුවෙන්."

අමල් යාළුවන්ට කිව්වෙ බොහොම ආදරෙන්. ඇත්තටම ඒ ආදරය ගලාගෙන ආවෙ අලුත් සර්ගෙන්. වෙනස් නායකයෙක් වෙන්න අමල්ට පුළුවන් බව කියා දුන්නෙත් සර්මයි. ලෝකයට වෙනස්, අලුත්, යහපත් නායකයො වැඩි වැඩියෙන් උවමනා බව අමල් ඉක්මනින්ම වටහාගත්තා. ඒකත් එක්තරා වික්‍රමයක් තමයි.

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 80

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | 4 | ■ | 5 | 6 | |
| | ■ | | ■ | 7 | | | ■ | | ■ |
| 8 | | | 9 | ■ | | ■ | 10 | | 11 |
| | ■ | 12 | | ■ | 13 | 14 | | | |
| ■ | 15 | ■ | 16 | 17 | ■ | | ■ | ■ | |
| 18 | | | ■ | 19 | | ■ | ■ | 20 | ■ |
| ■ | | ■ | 21 | | ■ | 22 | | | ■ |
| 23 | | | ■ | 24 | 25 | | ■ | 26 | |
| ■ | | ■ | 27 | ■ | 28 | | 29 | | ■ |
| 30 | | | | | ■ | 31 | | | |

**පහළට**

1. රටක මහජන නියෝජිතයන් පත්කර ගැනීම සඳහා භාවිත කරනු ලබන්නේ,
2. සංඛ්‍යාවක් ගුණ කළ යුතු වාර ගණන පෙන්වන ගණිත සංකේතය.
3. ගායන, වාදන, නර්තනවල සම වූ කාල ප්‍රමාණය.
4. ගම්පහ දිස්ත්‍රික්කයේ නගරයකි.
6. ශ්‍රී ලංකාවේ ප්‍රධානම බලය මේ නමින් හැඳින්වේ.
9. මිනිස්සු කණ්ඩායම.
10. ශරීර අවයවයකි.
11. සංගීත භාණ්ඩයකි.
14. දින, නැකැත් දක්වන පොත.
15. බලය විමධ්‍යගත කිරීම යනු
17. බලය පාවිච්චි කළ යුත්තේ මෙය සහිතවය.
20. රටක බලය හිමි ප්‍රධානතම ආයතනයි.
22. පැරණි රජ දවස නීති නියෝග දෙන ලද්දේ මෙමගිනි.
25. සතියට දවස්.
27. බලය ඇත්තෝ ________ දෙති.
29. "අතර" යන වචනය හා සබැඳේ.

**හරහට**

1. අවුරුදු 18 සපිරුණු පසු සෑම ශ්‍රී ලාංකිකයකුටම මෙය හිමි වේ.
5. "පොත්ත"
7. විජය රජුගේ පැමිණීමට පෙර ලංකාවේ විසූ ජන කොටසකි.
8. ඇසට පෙනෙන දේ.
10. විදුලිය ආරෝපිත පරමාණුවක් හෝ අණුවක්.
12. "කැඩුණු"
13. චිත්‍ර, මූර්ති, නැටුම්, නාට්‍ය, ගීත, වාදන ආදී කලා.
16. ධාන්‍ය විශේෂයක් / බාර්ලි
18. වේලාව.
19. අඩු පවුල් සංඛ්‍යාවකින් යුත් නාගරික නොවන ජනාවාසය.
21. මියන්මාරයේ හමුදා පාලනය නිසා සිරගත වී සිටින ජන නායිකාවගේ නමෙහි කොටසක්.
22. සිතෙහි එකඟ බව.
23. දෙවියන් මෙන් බලවත් වීමට පැරණි ගිවිසුමේ මිනිසුන් නිර්මාණය කළ කුලුන.
24. ඖෂධීය ගුණ ඇති, කුඩා ශාකයක හට ගන්නා දේශීය පලතුරක්.
26. "ශරීරය"
28. මෙය ලැබීමත් සමග බලය වැඩිවේ.
30. සැමරුම.
31. බලය ඇත්තෝ දුර්වල අයට ______ විය යුතුය.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2024 ජූලි 31 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 80**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 78 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 කා | ර් | තු | 2 ච | | 3 යා | ම | 4 යැ | 5 දු | ම |
| ති | | | ර | | බ | | 6 ද | ම් | |
| ක් | | 7 අ | ප්‍ර | සා | ද | ය | | | 8 දි |
| 9 ක | 10 වි | | සා | | | | 11 ටෝ | 12 කි | යෝ |
| | 13 ප්‍ර | 14 සා | ද | ති | 15 ධා | 16 න | | 17 ර | ශු |
| 18 ආ | වා | ස | ය | | 19 තු | ච | 20 ර | ලා | |
| 21 ච | ස | න | | 22 කෘ | | | ජ | | 23 දි |
| ර් | | | 24 ආ | ද | ර් | 25 ශ | ය | | ල් |
| ති | | 26 සෙ | මෙ | ත් | | ක | | 28 අ | ලි |
| 28 කා | යි | ල | ත් | ක | ය | | 29 රූ | ප | ය |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.


**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com


## ප්‍රහේලිකා අංක 78 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනී,

ප්‍රහේලිකා අංක 78 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගි වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභීන් වෙත ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - දිනුගි L. මංචනායක, 10 ශ්‍රේණිය ශු. පවුලේ බාලිකා මහ විද්‍යාලය, කුරුණෑගල.
- **දෙවන ස්ථානය** - ඉමෙත් ගෙත්මිර, 8 ශ්‍රේණිය H, මාරිස් ස්ටෙල්ලා විදුහල, තිඹිරිගස්කටුව.
- **තෙවන ස්ථානය** - නරේන් අබයකෝන්, 11 ශ්‍රේණිය, ශා. පීතර විද්‍යාලය, කොළඹ 4.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2024 සැප්තැම්බර් / ඔක්තෝම්බර් - "නායකයෝ"**

(සැප්. - ඔක්. කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 15 ට පෙර අප වෙත එවන්න.)

**2024 නොවැම්බර් / දෙසැම්බර් - "කඳුලයි සිනහවයි"**

(නොවැ. - දෙසැ. කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024

**නිවැරිදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පාස්කුවෙන් පසු ජුදා ආගමිකයන්ගේ ප්‍රධාන මංගල්‍යය කුමක්ද ?
   1) දිව්‍ය හෘදයේ මංගල්‍යය 2) පෙන්තකෝස්ත මංගල්‍යය
   3) ශු. ජපමාල මංගල්‍යය 4) ශ්‍රී ලේ මංගල්‍යය

2. තුන්දාහක් පමණ දෙනා මනස්තාපනය වී බව්තිස්මය ලැබුවේ කාගේ දේශනාව ඇසීමෙන් පසු ද?
   1) ස්නාවක ජුවාම් තුමාගේ 2) පාවුලු තුමාගේ 3) පේදුරු තුමාගේ 4) ජාකෝබ් තුමාගේ

3. ශුද්ධවූ සභාවේ උපන්දිනය ලෙස හඳුන්වන්නේ කවදා ද ?
   1) නත්තල් දිනය 2) පාස්කු ඉරිදාය 3) ගොබ් ඉරිදාය 4) පෙන්තකෝස්ත දිනය

4. සහනාධාර බෙදා දීම සඳහා අපෝස්තුළුවරුන් විසින් පත් කරන ලද්දේ කවුරුන්ද ?
   1) උපස්ථායකයන් 2) ගෝලයන් 3) හමුදා භටයන් 4) ජෙරුසලම් කාන්තාවන්

5. ශු. සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා කවරෙක් ද ?
   1) ශු. ජුවාම් තුමා 2) ශු. ස්තේපන් තුමා 3) ශු. ජෙරොම් තුමා 4) ශු. සන්තියාගෝ තුමා

6. "තාර්සස් හි" උපත ලැබුවේ පහත සඳහන් අයගෙන් කවරෙක් ද ?
   1) ශු. පාවුලු තුමා 2) ශු. ලූක් තුමා 3) ශු. ජොහාන් තුමා 4) ශු. තෙරේසා මව් තුමිය

7. දමස්කස් නගරයේ සිටි අනනියස් විසින් ප්‍රසාද ස්නාපනය දානය කරන ලද්දේ කා හට ද ?
   1) ජුවාම්ට 2) සාවුල්ට 3) ස්තේපන්ට 4) කොරනේලිස්ට

8. පේදුරු තුමාගේ මහා ප්‍රකාශය සිදු වුයේ කොහෙදී ද ?
   1) ගලීලයේ දී 2) ජෙරිකෝවේ දී 3) පිලිප්පි කයිසාරියේ දී 4) බෙතෙල්හි දී

9. ක්‍රිස්ටෝපර් වාස් සහ මරිය මිරැන්ඩා කාගේ මව්පියන් ද ?
   1) ජාකෝමේ ගොන්සාල්වේස් තුමාගේ 2) ස්නාවක ජොහාන් තුමාගේ
   3) මරිය තුමියගේ 4) ජුසේ වාස් මුනිතුමාගේ

10. ඔරතෝරියානු නිකායට අයත් පූජක තුමෙක් වන්නේ
   1) ජාකෝමේ ගොන්සාලවේස් පියතුමා 2) අගුස්තීනු තුමා 3) ජාකොබ් තුමා 4) සකරියස් තුමා

11. ප්‍රාග් ඉතිහාසය ලෙස ශු. බයිබලයේ සඳහන් වන්නේ කුමන පරිච්ඡේද ද ?
    1) උත්පත්ති 13-20    2) උත්පත්ති 1-11    3) උත්පත්ති 2-11    4) උත්පත්ති 11-20

12. මැවීම පිළිබඳ පළමු කථාව අයත් සම්ප්‍රදාය කුමක් ද ?
    1) J සම්ප්‍රදාය    2) E සම්ප්‍රදාය    3) P සම්ප්‍රදාය    4) D සම්ප්‍රදාය

13. දූවිල්ලෙන් දූවිල්ලට හැරීම කා හට දුන් දඬුවමක් ද ?
    1) ඒවට    2) ජුවාම් තුමාට    3) ගලීල ස්ත්‍රීන්ට    4) ආදම්ට

14. "ඔහුගේ පරම්පරාවේ නිදොස් මිනිසා ඔහු වීම" මේ කොටසින් හඳුන්වන පුරාණ ගිවිසුමේ තැනැත්තා ...
    1) ආබ්‍රහම්    2) නෝවා    3) මෝසෙස්    4) ආරොන්

15. "මම නුඹ මඟින් විශාල ජාතියක් ඇති කරන්නෙමි". මේ වාක්‍ය හා සම්බන්ධ පුද්ගලයා ...
    1) මෝසෙස් තුමා    2) ආරොන් තුමා    3) ආබ්‍රහම් තුමා    4) ඊසාක් තුමා

16. "මම නුඹ සමඟ සිටිමි". මෙසේ පවසමින් දෙවියන් වහන්සේ දිරිමත් කළ තැනත්තා ...
    1) මෝසෙස් තුමා    2) ස්නාවක ජුවාම් තුමා    3) ආබ්‍රහම් තුමා    4) පාවුලු තුමා

17. පාපය නැති කිරීම සංකේතවත් කිරීමට යොදාගෙන ඇත්තේ කුමක් ද ?
    1) ජල ගැල්ම    2) සර්පයාගේ හිස පොඩි කිරීම    3) දේදුන්න    4) දස පණත

18. දේදුන්නෙන් සංකේතවත් කරන්නේ කුමක් ද ?
    1) නැවත ජලගැල්මක් ඇති වන බව    2) සර්පයා
    3) ස්වයංපෝෂිත බව    4) නැවත ජලගැල්මකින් ලෝකය විනාශ නොවන බව

19. "චර්මච්ඡේදනය" දෙවියන් වහන්සේ කා සමග ඇතිකර ගත් ගිවිසුමක බාහිර සලකුණක් ද ?
    1) ඊසාක් සමග    2) මෝසෙස් සමග    3) ආබ්‍රහම් සමග    4) ජෝෂුවා සමග

20. එඬේරික ජීවිතයක් ගත කළ ඊශ්‍රායෙල් ජනතාව දේව ජනතාවක් බවට පත්වන්නේ කුමක් මගින් ද ?
    1) චර්මච්ඡේදනය මගින්    2) දවන යාග පූජා මගින්
    3) වන්දනා පිළිවෙත් මගින්    4) සීනයි ගිවිසුම මගින්

**පිළිතුරු**

(1). 2  (2). 3  (3). 4  (4). 1  (5). 2  (6). 1  (7). 2  (8). 3  (9). 4  (10). 1
(11). 2  (12). 3  (13). 4  (14). 2  (15). 3  (16). 1  (17). 2  (18). 4  (19). 3  (20). 4

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

## නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම IV
## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්
## නව ගිවිසුම් සමයේ පලස්තීනයේ ආගමික පසුබිම/කණ්ඩායම්

පලස්තිනයේ ජුදාවරුන් ඒක දේවවාදය පිළිගත් පිරිසකි. ඒක දේවවාදයේ නියුතු ජනතාව තමන්ගේ ආගමික මධ්‍යස්ථානය ලෙසත් ජුදා දහමේ වන්දනා ස්ථානය ලෙසත් සලකන ලද්දේ ජෙරුසලම් දේව මාලිගාවය. විවිධ නම්වලින් දෙවියන් වහන්සේව හඳුන්වනු ලැබූහ. "එල්" යනු දෙවියන් වහන්සේව හඳුන්වන පොදු නාමයයි.

උදාඃ එල්-එලොහිම් - මැවුම්කරුවන දෙවියන් වහන්සේ
එල් - ඒලිඔන් - මහොත්තම වූ දෙවියන් වහන්සේ
එල් - ෂඩායි - සියලු බලැති දෙවියන් වහන්සේ

යන නාමයන් ගෙන් යැදුම්, භාරහාර, පඬුරු, යාග පූජා ඔප්පු කළහ.

**ජෙරුසලම් දේව මාලිගාව**

දාවිත් රජු (ක්‍රි.පූ.1000-960) දේව මාලිගාව ඉදි කිරීමට ජෙරුසලම් නගරයෙන් ඉඩමක් මිල දී ගත්තේය. දේව මාලිගාව ඉදි කිරීමට අවශ්‍ය සියලු ද්‍රව්‍ය රැස්කර තැබීය. එහෙත් ඔහුට දේව මාලිගාව ගොඩනැගීමට නොහැකි විය. පසුව ඔහුගේ පුත්‍ර සලමොන් රජු (ක්‍රි.පූ. 960-922) බලයට පත්වීමෙන් පසුව ලොව අනර්ඝම වස්තූන් භාවිත කරමින් ඒ ඉදිකිරීම නිම කළේය. එතෙක් මණ්ඩපයක ස්ථාපිත කර තිබූ ගිවිසුම් කරඬුව ගෙනැවිත් දේව මාලිගාවේ තැන්පත් කළේය. ක්‍රි.පූ. 597-587 කාලයේ දි බැබිලෝනියේ අධිරාජයා වූ නබුකද්නේසර් විසින් දේව මාලිගාව කඩා විනාශ කර දමා ඇත. අපර විප්‍රවාසයට පසුව ක්‍රි.පූ. 515 දී දේව මාලිගාව නැවත ප්‍රතිසංස්කරණය කරන ලදි. ඉන් පසුව ක්‍රි.පූ. 71 දී ජුදා රෝම කැරැල්ල හේතුවෙන් දේව මාලිගාව නැවත විනාශ වී ගියේය.

**ධර්ම ශාලාව - සිනගෝගය**

බැබිලෝනිය විප්‍රවාසයට රැගෙන ගිය ජනතාවට එහිදී වන්දනා කිරීමට දේව මාලිගාව නොවීය. නැවත ජුදයාවට පැමිණියත් බැබිලෝනියේ හමුදාව දේව මාලිගාව විනාශකර දමා තිබුණි. ඒ නිසා ජුදාවරුන් බැබිලෝනියේ දි තම ආගමික කටයුතු ඉටු කරගැනීමට ධර්ම ශාලාව හෙවත් සිනගෝග ඉදි කරගෙන ඇත. සිනගෝගය යන්න ග්‍රීක් වචනයකි. එහි තේරුම ධර්ම ශාලාව වේ. එසේ නොමැති නම් "ජනතාව එකතු වන" ස්ථානය යන්නය. ජනතාව රැස්වන ස්ථානයට සිනගෝගය ලෙස භාවිත විය. මෙහි ජුදාවරු පැමිණ යාච්ඤා කිරීම, දේව වාක්‍ය කියවීම සිදු කළහ. ආගමික පිළිවෙත් ඉටු කිරීමක් එහි දී සිදු නොවීය. ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේදි නාසරෙත්, ගලීලය, කපර්නාවුම ආදී ප්‍රදේශවල ධර්මශාලා තිබී ඇත.

**ආගමික නීතිය**

ජුදා දහම ආගමික නීති රීති දැඩිලෙස පිළිපදින ලදි. තමන් විසින් කළ යුතු කටයුතු කවරේද නොකළ යුතු කටයුතු කවරේද යන්න ලිඛිතව නීතියේ සඳහන් කර ඇත. නීතිය පිළිපැදීමෙන් පමණක් දෙවියන් වහන්සේට අවනතව ජීවත් විය හැකිය. පිරිසිදු ජීවිතයක් ගතකිරීමට නම් නීතිය පිළිපැදීම අනිවාර්ය කර තිබුණි. සබත් නීතිය ප්‍රධාන තැනක් ගත්තේය. කුමන බාධා පැමිණියත්, කිනම් යහපත් වැඩක් තිබුණත් ඒ සියල්ල අතහැර සබත පැවැත්විය යුතුය. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ සබත් දිනයේදි පවා යහපත් වැඩ කළසේක. උන්වහන්සේ පෙන්වා දුන්නේ " මිනිසා සබත උදෙසා නොව සබත මිනිසා උදෙසා" බවයි.

**සැන්හෙන්ඩ්‍රින් සභාව**

සැන්හෙන්ඩ්‍රින් සභාව යන්නෙන් අදහස් කරන්නේ ජුදා මන්ත්‍රණ සභාවයි. මෙය ශ්‍රේෂ්ඨාධිකරණය ලෙසද හැඳින්වේ. මෝසෙස් තුමාගේ කාලයේ සිට මෙවන් සභාවක් තිබූ බව සඳහන් වුවත් එය සැන්හෙන්ඩ්‍රින් සභාව තරම් විධිමත් නොවේ. ඒ සභාවේ ප්‍රධානියා උත්තම පූජකයාය. තවත් නායක පූජකවරුන්, ප්‍රජා මූලිකයන්, පරිසිවරුන්, විනයධරයන් ඇතුළු 70 දෙනෙක් එම සභාවේ සාමාජිකත්වය දරති. මේ සභාව රැස්වන්නේ දේව මාලිගාවේම ශාලාවකය. මරණීය දණ්ඩනය පුද්ගලයකුට නියම කළ හැක්කේ රෝමානු අධිරාජයාගේ නියෝජිත ආණ්ඩුකරුට පමණි.

ක්‍රිස්තුස් වහන්සේව වැරදි කරුවකු ලෙස චෝදනා කළේ මේ සභාවය. කසපහර දීම, දඩ මුදල් නියම කිරීම, දේවමාලිගයෙන් නෙරපා දැමීම, සිරගත කිරීම වැනි දඬුවම් දීමට ඒ සභාවට බලය ඇත. මන්ත්‍රණ සභාව විනිශ්චය ලබා දිය යුත්තේ මිෂ්නා නීතියට අනුවය. ආරම්භයේ ජෝසප්, නිකදේමුස්, පාවුලු තුමාගේ ගුරුවරයා වූ නතානියෙල්

සැන්හෙනඩ්‍රින් සභාවේ සාමාජිකත්වය දැරූහ.

**ආගමික පුද පූජා**

දේව මාලිගාවේ සිදුවන වාර්ෂික මංගල්‍ය 3 කි.

1. ජුදා පාස්කුව සැමරීම (පාස්කු මංගල්‍යය) ඒ පිළිවෙතේ ප්‍රධාන අංග දෙකකි.
    1. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත
    2. නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත
2. කූඩාරම් මංගල්‍යය
3. පෙන්ත කොස්ත මංගල්‍යය හෙවත් අස්වනු මංගල්‍යය

ජුදාවරු දේව මාලිගාවට ඇතුළු වීමට පෙර අත් පා සෝදා පිරිසිදු කරගත යුතුය. එසේ නොමැතිව දේව නමස්කාරයට සහභාගි විය නොහැකිය, එය නීතියකි. සෑම පිරිමි දරුවකුම දරුවා බිහිවී 8 වන දිනට පසුව 40 වන දිනට පෙර දේවස්ථානයට ගෙන ගොස් චර්මච්ඡේදනය කළ යුතුය. වයස අවුරුදු 12 වූ විට පිරිමි දරුවන් දේව මාලිගාවට ගෙන ගොස් නායක පූජකයා ඉදිරියේ ව්‍යවස්ථාවේ පුත්‍රයකු ලෙස නම් කළ යුතුය. සෑම පිරිමි දරුවකුම දේව මාලිග යට හෝ සිනගෝගයට ගොස් ජුදා නීතිය ඉගෙන ගැනීම අනිවාර්ය විය. ව්‍යවස්ථාව උගන්වන ලද්දේ විනයධරයන් විසිනි.

**ආගමික කණ්ඩායම්**

තමන් ජුදා ආගම තුළ වඩාත් ගැඹුරින් ආගමික කටයුතු කරන පිරිසක් ලෙස පෙන්වා දීමට උත්සාහ දැරීම හේතුවෙන් ආගමික ජන කොටස් බිහි විය. එසේම ඔවුන් තුළ අනුගමනය කරන ආගමික ප්‍රතිපත්ති අතර වෙනස්කම් දැකිය හැකිය. ඔවුන් අතර 1. පරිසිවරු හා විනයධරයෝ 2. සද්දුසිවරු 3. සෙලරිවරු 4. එසේනිවරු 5. අන්ත ජාතිවාදීහු 6. හෙරෝදිවරු ලෙස කණ්ඩායම් කිහිපයකි.

**පරිසිවරු හා විනයධරයෝ**

"පරිෂ්" "පෙරුසීම්" යන හිබෲ වචනය පරිසි යන්න ව්‍යවහාර වේ. ඒ වචනයේ අර්ථය "වෙන්වී සිටීම" ලෙස පෙන්වා දිය හැකිය. මොවුන් ජුදා දහමට පටහැනි, විදේශීය සම්ප්‍රදාය සියල්ල බැහැර කරයි. ජුදා ජනතා පාලනය වෙනත් රජවරුන් සිදුකිරීම ප්‍රතික්ෂේප කරයි. දෙවියන් වහන්සේ තමන්ගේ එකම රජු ලෙස පිළිගනී. ඔවුන් "ව්‍යවස්ථාවේ ජනයා" ලෙස විරුදාවලි ලබා ඇත.

පරිසිවරුන්ගේ විශේෂ ලක්ෂණ කිහිපයකි

* ආත්මයේ අමරණීය බව, මරණයෙන් පසුව විනිශ්චය, උත්ථානය, දේව දූතයන් කෙරෙහි විශ්වාසය මොවුන් තුළ පවතී.

* ලිඛිත සම්ප්‍රදාය මෙන්ම වාචික සම්ප්‍රදායද පිළිගනිති.

* දේව රාජ්‍යයේ උදාව සහ දාවිත්ගේ වංශයෙන් මෙසියස් තුමා පැමිණෙන බලාපොරොත්තුවද ඇතිව ජීවත් වෙති.


* පරම්පරා ගත සම්ප්‍රදාය හිස මුදුනින් පිළිගත් අතර ව්‍යවස්ථාව අකුරටම පිළිපදිති.

* ආගමික චාරිත්‍ර සඳහා මුල්තැනක් දුන් අතර ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් විශේෂ ආකාරයකට සකස් කරති.

විනයධරයකු වීමට නම් පරිසිවරයෙක් විය යුතුය. එහෙත් සෑම පරිසිවරයකුම විනයධරයකු නොවේ. පරිසිවරයා ආගමිකව මුහුකුරා ගිය අයකු ලෙස තම ආගමික කණ්ඩායම සලකන්නේ නම් ඔහු විනයධරයෙක් වේ. ව්‍යවස්ථාව ලියා තබන්නේ, අර්ථකථනය කරන්නේ මොවුන්ය. මොවුන්ගේ රාජකාරි අතර මෝසෙස්ගේ නීතිය ලියා තැබීම, ජුදෙව් සමාජයේ නීති රීති සම්පාදනය කිරීම, ඒවා අර්ථ කථනය කිරීම, ආරක්ෂා කිරීම විශේෂ වේ. විනයධරයන් බිහිවන්නේ බැබිලෝනිය විප්‍රවාසයෙන් පසුවය. විප්‍රවාසය නිමා වී නැවත ජෙරුසලමට පැමිණි පසුව ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමට ජනතාව උනන්දු කළේ මොවුන්ය. මේ ජන කණ්ඩායම ලෙවී වාංශිකයන් අතරින් බිහිවූ පිරිසකි. මොවුන් අතර ප්‍රථම විනයධරයා ලෙස සැලකෙන්නේ "එස්රා" නැමැත්තාය.

මේ පිරිස මංසංධිවලට ගොස් ජනතාවට පෙනෙන ලෙස යාච්ඤා කළහ. තමන් ධාර්මිකයන් යයි සමාජයට ඒත්තු ගැන්වීමට තම වස්ත්‍රයේ දාවල්ල පළල් කළහ. දේව වාක්‍ය ලාංඡන තම නළලේ සටහන් කළහ. එයට හේතු ලෙස ඉදිරිපත් කරන ලද්දේ ජේසුස් වහන්සේ සබත කඩ කිරීම, පව්කාර පුද්ගලයන්ට සමාව දානය කිරීම යන කරුණුය. විනයධරයන් සහ පරිසිවරු ආගමේ නාමයෙන් සාමාන්‍ය ජනතාව දැඩි පීඩනවලට ලක් කළ පිරිසකි. ක්‍රිස්තුස් වහන්සේ ඔවුන්ගේ ක්‍රියා ප්‍රතික්ෂේප කළ සේක. උන්වහන්සේ පරිසිවරුනට හා විනයධරයන්ටත් ප්‍රේමයේ පනත ඉගන් වූ සේක. එහෙත් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට මොවුහු ද වගකිවයුත්තෝ වූහ.

සටහන ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා


UNITED PROFESSIONALS AGENCIES
වසර 25 කට වඩා වැඩි ක්ෂේත්‍රයේ පළපුරුදු
බලපත්‍රලාභී ආයතනයකි.
කරදරකාරී
පලිබෝධකයන්
මර්දනය
RESIDENTIAL - COMMERCIAL - INDUSTRIAL
PROVIDE ALL TYPES OF
PEST CONTROL SERVICES
දිවයින පුරා සේවාව සපයයි.
නිවාස
නව ඉදිකිරීම්
පාසල්
හෝටල්
කර්මාන්තශාලා
ව්‍යාපාරික ස්ථාන
WITH OVER
25 Years
EXPERIENCE
LICENSED & INSURED
FAST RESPONSE
24 HOURS EMERGENCY SERVICES
PROFESSIONAL WORKS
CALL US TODAY
071-5362618 / 071-5362624
No, 740, Thorana Junction, Wedamulla, kaleniya.
Made with PosterMyWall.com

## 23 වසරක් පුරා වන්දනා චාරිකා සංවිධානය කළ අප සමඟ විශ්වාසයෙන් සම්බන්ධ වීමට ඔබට අවස්ථාවක්

**දින 06 චාරිකාව**
### වේලන්කන්නි චෙන්නායි
වේලන්කන්නි දේවස්ථානය,
ශු. තෝමස් අපෝස්තුළුතුමාගේ දේවස්ථානය,
චෙන්නායි නගර සංචාරය
ජුනි 17, ජුනි 24, ජුලි 01, ජුලි 15
අගෝ. 21, සැප්. 23, ඔක්. 7
**රු. 139,500/-**

**දින 06 චාරිකාව**
### ට්‍රිචි, පූන්ඩි මාතා චෙන්නායි, වේලන්කන්නි
පූන්ඩි මාතා දේවස්ථානය,
වේලන්කන්නි දේවස්ථානය,
ශු. තෝමස් අපෝස්තුළුතුමාගේ දේවස්ථානය,
චෙන්නායි නගර සංචාරය
අගෝ. 15, සැප්. 30
**රු. 144,000/-**

**දින 06 චාරිකාව**
### ගෝවා චෙන්නායි
ශු. තෝමස් අපෝස්තුළුතුමාගේ දේවස්ථානය,
ශු. ප්‍රැන්සිස් ෂවියර්තුමාගේ සිද්ධස්ථානය,
චෙන්නායි නගර සංචාරය
නොවැ. 25, දෙසැ. 02, දෙසැ. 17
**රු. 196,000/-**

**දින 09 චාරිකාව**
### ගෝවා, චෙන්නායි සහ වේලන්කන්නි
ශු. ප්‍රැන්සිස් ෂවියර්තුමාගේ සිද්ධස්ථානය,
ශු. තෝමස් අපෝස්තුළුතුමාගේ දේවස්ථානය,
වේලන්කන්නි දේවස්ථානය,
චෙන්නායි නගර සංචාරය
දෙසැ. 08, ජන. 02 2025
**රු. 258,000/-**

**දින 10 චාරිකාව**
### ලූර්දුව පාතිමාව
ලූර්දුව, ස්පාඤ්ඤය,
පාතිමාව, ලිස්බන්
සැප්. 11
**රු. 890,000/-**

**දින 06 චාරිකාව**
### ලූර්දුව
ඔක්. 14
**රු. 590,000/-**

**දින 08 චාරිකාව**
### ශුද්ධ වූ දේශය
ජෙරුසලම, බෙත්ලෙහෙම, ගලීලය,
නාසරත ඇතුළු බොහෝ ස්ථාන
ජූලි 22
**රු. 680,000/-**

- ✔ සෑම කණ්ඩායමක් සමගම ගරු පියතුමෙකු සහභාගි වන බැවින් සිංහල භාෂාවෙන් දිව්‍ය පූජාවට සහභාගි වීමේ අවස්ථාව.
- ✔ පෞද්ගලික යාච්ඤාව සඳහා කාලය
- ✔ උදෑසන, දිවා, රාත්‍රී ආහාර බුෆේ ක්‍රමයට
- ✔ තරු 4 හෝටලයන් පහසුකම් සහ වායු සමනය කරන ලද ප්‍රවාහන පහසුකම්.
- ✔ යාමට සහ ඒමට ගුවන් ටිකට්පත් සහ වීසා ගාස්තු.

අප ආයතනයේ අධ්‍යක්ෂතුමා සෑම චාරිකාවක් සමග ම මඟපෙන්වීමෙන් සහභාගී වේ.

** කොන්දේසි වලට යටත්.

## ස්කයි ලයින් ට්‍රැවල්ස් (පුද්) සමාගම.

පළමු මහල, ජුබිලි ශාලාව, ශාන්ත මරියා දේවස්ථානය, මහවිද්‍ය, මීගමුව.
අංක 12,
විමසීම්: 037 2052590 / 031 2283555 / 0777 370 218 / 0777 797 428
info@skylinetravels.lk / www.skylinetravels.lk

IATA Accredited Agent



මිල රු.100/-
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/01/2024